PAFFREL



# මැතිවරණය හා පුරවැසියා

# මැතිවරණය හා පුරවැසියා

## මැතිවරණ ක්‍රියාවලියේදී පුරවැසි ක්‍රියාකාරීත්වයක් සඳහා අත්වැලක්

**සම්පාදනය**

නීතිඥ ජගත් ලියනආරච්චි

LL.B (Colombo), MA (Mass Communication-Kelaniya)

**ප්‍රකාශනය**

නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL)

# මැතිවරණය හා පුරවැසියා

## මැතිවරණ ක්‍රියාවලියේදී පුරවැසි ක්‍රියාකාරීත්වයක් සඳහා අත්වැලක්

ප්‍රථම මුද්‍රණය-2019 පෙබරවාරි

ISBN 978-955-4082-06-9

**සම්පාදනය**

නීතිඥ ජගත් ලියන ආරච්චි

LL.B (Colombo), MA (Mass Communication-Kelaniya)

**පිටු සැකසුම**

Grace En-Tzu Chang

**ප්‍රකාශනය**

නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL)

නො.16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

**මුද්‍රණය**

නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL)

නො.16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

# මැතිවරණය හා පුරවැසියා

## මැතිවරණ ක්‍රියාවලියේදී පුරවැසි ක්‍රියාකාරීත්වයක් සඳහා අත්වැලක්

# පෙළගැස්ම


I. පෙරවදන ........................................ 1
II. රාජ්‍යය හා ඡන්ද බලය ........................................ 3
III. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීති ........................................ 6
IV. මැතිවරණයක පාර්ශවකරුවෝ ........................................ 12
V. මැතිවරණයක ක්‍රියාවලිය ........................................ 18
VI. මැතිවරණ ප්‍රචාරණය ........................................ 27
VII. බහුලව සිදුවන මැතිවරණ නීති උල්ලංඝනයන් ........................................ 33
VIII. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා පුරවැසි භූමිකාව ........................................ 38
IX. යහපත් අපේක්ෂකයකු තෝරාගන්නේ කෙසේද? ........................................ 41
X. මැතිවරණ සමයේ නිතර භාවිතාවන වදන් මාලාව ........................................ 49
XI. මැතිවරණ නිළධාරීන්ගේ දුරකථන සම්බන්ධතා ........................................ 55
XII. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ........................................ 59

# 1. පෙරවදන

# I. පෙරවදන

සාධාරණ මැතිවරණ මෙන්ම නිවැරදි මහජන නියෝජිතයන්ද රටක ඉදිරි ගමනට තීරණාත්මක මෙහෙයක් ඉටුකරයි. එබැවින් මැතිවරණයේ සුපිලිපන්නභාවයෙන් ඔබ්බට ගිය පුරවැසි කාර්යය භාරය ඉටු කිරීම සඳහා අවැසි දැනුවත්භාවය සපයන **මැතිවරණ හා පුරවැසියා** පොත ඔබ අතට පත්වන්නේ පුරවැසි සංවිධාන තුනක උත්සහයකිනි. ඒ පැෆ්රල් සංවිධානය, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මධ්‍යස්ථානය හා ඊෆ්රියල් ආයතන යන ආයතන තුනෙහි එකතුවෙනි. මෙම පොත මුද්‍රණය කර ඔබ අතට පත් කරන ආයතන තුන තුළම ඇත්තේ එකම අපේක්ෂාවකි. ඒ මෙම පොත පරිශීලනය කරන ඔබ මැතිවරණ නීතියට අනුගතව ඔබේ දේශපාලන ක්‍රියාකාරීත්වය මෙහෙයවනු ඇති බවත්, ඔබ ඡන්ද දායක භූමිකාවෙන් ඔබ්බට ගොස් පුරවැසියෙකු ලෙස බුද්ධිමත්ව තාර්කිකව ඔබගේ මහජන නියෝජිතයින් තේරීමට ක්‍රියාකරනු ඇතැයි අප තුල වන විශ්වාසයයි.

එමෙන්ම මෙම පොත මගින් ඔබ ලබන දැනුම ඔබ සමග සිටින අනෙකුත් සගයින්, සංවිධාන හා පුරවැසියා දැනුවත් කිරීමට ඔබ භාවිතා කරනු ඇතැයි අප දැඩිසේ විශ්වාස කරමු.

අපගේ ඉල්ලීම අනුව පොත සම්පාදනය කළ නීතීඥ ජගත් ලියන ආරච්චි මහතාටත් අද දවසේ මෙම පොත් පිංච භාවිත කර ජනතාව දැනුවත් කිරීමේ යෙදෙන ඔබටත්, පැෆ්රල් සංවිධානයේත්, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා මධ්‍යස්ථානයේ හා ඊෆ්රියල් ආයතනයේ ගෞරවය පිරිනමමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක
පැෆ්රල් සංවිධානය

# II. රාජ්‍යය හා ඡන්ද බලය

# II. රාජ්‍යය හා ඡන්ද බලය

මානව ඉතිහාසයේ මුල් කාලීනව රටක හෝ රාජ්‍යයක සමස්ත අයිතිය හිමිව පැවතියේ පාලන බලය සතුව පැවති රජුට හෝ පාලකයාටය. නමුත් ජනරජයන් බිහිවීමත් සමගම රාජ්‍ය නායකත්වය ජනතා කැමැත්ත මත සිදුවන්නට විය. ඒ සමගම රටක අයිතිය එම රටහි පුරවැසියන්ට අයිතිය යන සංකල්පය බිහිවිය. මෙම තත්ත්වය තවත් වර්ධනය වී ජනරජයක පරමාධිපත්‍යය හෙවත් ස්වාධිපත්‍යය පුරවැසියන් සතුව පවතින බවට පිලිගැනීමක් ඇතිවිය.


පුරවැසියන් සතු මෙම පරමාධිපත්‍ය බලයේ කොටස් 3ක් පවතී. එනම්

1. පාලන බලතල
2. ඡන්ද බලය
3. මානව හිමිකම්

මේ අතරින් පුරවැසියන් සතු පාලන බලතල පුරවැසියන් විසින් භාවිතා නොකරන අතර එකී බලතල භාවිතා කරනු ලබන්නේ රජය විසිනි. එකී පාලන බලතල කොටස් 3කින් යුක්තය. එනම්

1. විධායක බලතල
2. ව්‍යවස්ථාදායක බලතල
3. අධිකරණ බලතල

මෙම බලතල හුවමාරුව පිළිබඳව පහත සටහනින් පැහැදිලි කළ හැකිය.



මෙම සටහන අනුව පුරවැසියන් සතු විධායක ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල රජයට ලබාදෙන නමුත් ඡන්ද බලය හා මානව හිමිකම් කිසිවෙකුට නොදී තමන් සතුව තබාගන්නා බවයි.

එසේ විධායක ව්‍යවස්ථාදායක හා අධිකරණ යන පාලන බලතල රජයට ලබාදී එකී බලතල රජය විසින් නිසියාකාරව ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම පිණිස පුරවැසියන් ඡන්ද බලය හා මානව හිමිකම් භාවිතා කරයි.

මේ අනුව පුරවැසියන්ට ඡන්ද බලය හා මානව හිමිකම් ලැබෙන්නේ ජනතා පරමාධිපත්‍යයේ අන්සතු කළ නොහැකි කොටසක් ලෙසය. එපමණක් නොව රජය යනු පුරවැසියන්ගේ පාලන බලතල පුරවැසියන් වෙනුවෙන් භාවිතා කරන ආයතනයක් වන බැවින් සෑම රාජ්‍ය නියෝජිත ආයතනයක් හා නිලධාරියෙකුම පුරවැසියන් සතු ඡන්ද බලයට හා මානව හිමිකම්වලට ගරු කළ යුතුය.

මේ නිසා සෑම ජනරජයකම සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පුරවැසියන් හා රජය අතර පවතින මෙම සබඳතාව ලේඛනගත කර තිබේ. එකී ලේඛනගත කර තිබෙන ආකාරය අනුව එක් එක් රාජ්‍යයන්ගේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා බලතල තේරුම්ගත හැකිය.

මේ අනුව සෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකම නියමිත කාල වකවානුවක් තුල මැතිවරණ පැවැත්වීම හා ඒ මගින් ජනතා නියෝජිතයින් පත්කර ගැනීම සිදු කරනු ලබයි.

ඒ අනුව ජනතා පරමාධිපත්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් වන්නේ ඡන්දය භාවිතා කිරීමයි. එය ස්වාධිනව හා නිදහස්ව පැවැත්වීම තුලින් රටක නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බිහිකර ගත හැකිය.

# III. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීති

# III. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීති

## මැතිවරණ පිළිබඳ මූලික නීතීය

ශ්‍රී ලංකාවේ පවත්වන මැතිවරණ පිළිබඳ මූලික නීතිමය ප්‍රතිපාදන ඇතුලත් වන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුලයි. ඒ අනුව ලංකාවේ පවතින මැතිවරණ වල මූලික ලක්‍ෂණය වන්නේ මහජන නියෝජිතයින් තෝරා පත්කර ගන්නේ සමානුපාතික නියෝජිත ක්‍රමයට අනුව වීමයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ XIII හා XIV වන පරිච්ඡේදයන් හි මැතිවරණ ක්‍රියාවලියට අදාල මූලික නීතිය ඇතුලත් වේ.ඒ අනුව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 88 හා 89 ව්‍යවස්ථා අනුව-

- ශ්‍රී ලාංකික පුරවැසියකු වන
- වයස අවුරුදු 18 සම්පූර්ණ කරන ලද
- අදාල ඡන්ද නාමලේඛණයේ නම ලියාපදිංචි වී ඇති

සෑම තැනැත්තෙක්ම ජනාධිපතිවරයා තෝරාපත් කිරීමේ ඡන්ද විමසීමකදී සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයකදී ඡන්ද හිමියකු වීමට හෝ යම්කිසි ජනමත විචාරණයකදී ඡන්දය දීමට හෝ මූලික වශයෙන් සුදුස්සෙක් වන්නේය. ඡන්ද දායකයකු වීමේ නුසුදුසුකම්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබේ එම කරුණු "*මැතිවරණයක පාර්ශවකරුවෝ*" යන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරමු.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුල පවතින මූලික මැතිවරණ නීතිවලට අදාල පටිපාටිය නීතීන් කලින් කලට පාර්ලිමේන්තුව විසින් සම්මත කරගනු ඇත ඒ අනුව-

1. 1981අංක 15 දරන ජනාධිපතිවරණ පනත
2. 1981 අංක පාර්ලිමේන්තුව මැතිවරණ පනත
3. 1988 අංක 15 දරන පළාත්සභා ඡන්ද විමසීමේ පනත
4. 1946 අංක 53 දරණ පළාත්පාලන ඡන්ද විමසීම් ආඥා පනත
5. 1981 අංක 7 දරණ ජනමත විචාරණ පනත
6. 1980 අංක 4 දරණ ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ පනත

ආදී නීතීන් ඒ ඒ මැතිවරණයට අදාලව මූලික නිතීන් ලෙස කටයුතු කරයි. මෙම සියළුම මැතිවරණ මෙහෙය වීමේ පූර්ණ බලධාරියා වන්නේ මැතිවරණ කොමිෂන් සභාවයි. මේ අනුව ශ්‍රී ලංකාව තුල.

මැතිවරණ හා ඡන්ද විමසීම් වර්ග 5ක් පවත්වනු ලැබේ. එනම්-

# පාර්ලිමේන්තු මැතිවරණ

වසර 5 ක නිළකාලයක් සඳහා පාර්ලිමේන්තු මංත්‍රීවරුන් 225 ක් තෝරාපත්කර ගැනීම සඳහා පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්වේ.

මෙම මැතිවරණය පිළිබඳව මූලික නීතිරීති ඇතුලත්වන්නේ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතෙහිය. ඒ අනුව ලංකාවට මැතිවරණ කොට්ඨාශ 22 ක් ලෙස සලකා සමානුපාතික නියෝජන ක්‍රමයට අනුව මන්ත්‍රීවරුන් 196ක් පත්කරගන්නා අතර තවත් මන්ත්‍රිවරුන් 29 දෙනෙක් ජාතික ලැයිස්තු මගින් තොරාගනු ලබන අතර,ඒ ඒ පක්‍ෂ ලංකාවේ ලබාගත් ඡන්ද වලට අනුරූප ලෙස තෝරාගනු ලබයි. මෙම මැතිවරණය මුළු ලංකාවට ආවරණය වන පරිදී එකම දිනයට පැවැත්විය යුතුය.

ඡන්දය පවත්වන දිනය තීරණය කිරීම් බලය, නාම යෝජණා භාරගැනීමේ කාලසීමාව නියම කිරීම බලය ජනාධිපතිවරයා සතු වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැරිය ද ඊළග මැතිරවණයෙන් පසුව අමාත්‍ය මණ්ඩලයක් පත් කරන තෙක් පවතින අමාත්‍ය මණ්ඩලය එලෙසම පවතිනු ඇත.

# ජනාධිපතිවරණය

ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රධානියාද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද වන ජනාධිපතිවරයා අවුරුදු 5 ක නිළ කාලයක් සඳහා තෝරා පත්කර ගනු ලබන්නේ ජනාධිපතිවරණය තුලින්ය. මෙම ජනාධිපතිවරණ ද එකම දිනයක ලංකාව මුළුල්ලේම පැවැත්විය යුතුය. එහිදී වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩකට වැඩි ප්‍රමාණයක් ලබාගන්නා ජනාධිපති අපේක්‍ෂයකු ජයග්‍රහණය කරනු ලබයි. අඩකට වඩා ඡන්ද ලබාගැනීමට කිසිදු අපේක්‍ෂකයකු අපොහොසත් වුවහොත් දෙවෙනි මනාපය ගනන් කරණු ලබයි.

සමාන්‍ය වශයෙන් වසර 5 ක නිළ කාලයක් සඳහා ජනාධිපතිවරයෙක් පත්වන බැවින් ජනාධිපතිවරණය වසර 5 කට වරක් පැවැත්විය යුතු වුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

ප්‍රතිපාදන අනුව වසර 4 කට පසුව එළඹෙන ඕනෑම අවස්ථාවක නැවත ජනාධිපතිවරයෙක් නියම කිරීමේ හැකියාව බලයේ සිටින ජනාධිපතිවරයා සතුය.

දැනට පවතින නීතියට අනුව එක් පුද්ගලයකුට ජනාධිපති ධූරය දැරිය හැක්කේ වාර දෙකක් පමණි.

බලයේ සිටින ජනාධිපතිවරයකු ජනාධිපති ධූරය සඳහා නැවත තරග වදින අවස්ථාවේදී එකී බලයේ සිටින ජනධිපතිවරයා ද්විත්ව චරිතයක් රඟදක්වයි. එනම් රටේ විධායක ජනාධිපති ලෙස හා ජනාධිපති අපේක්ෂකයා ලෙසයි.

# පළාත් සභා මැතිවරණය

පළාත් සභා සඳහා මහජන නියෝජිතකින් වසර 5 ක කාලයක් සඳහා තෝරා පත්කරගනු ලබන්නේ පළාත් සභා මැතිවරණ මගින්ය. පළාත් සභා 9 සඳහා පළාත් සභා ඡන්ද විමසීම් මගින් මහජන නියෝජිතයින් 437 ක් පත්කරගනු ලැබේ. මෙම මැතිවරණ එක් එක් පළාත් සභා සඳහා එක් එක් අවස්ථාවන් හිදී පවත්වනු ලැබේ. වසර 5 ක කාලය ඉක්මයාමට ප්‍රථමව වුවද ආණ්ඩුකාරවරයාට එකී පලාත විසුරුවාහැරීමේ බලය හිමිවේ. පළාත් සභා ඡන්ද විමසීමක් පවත්වන්නේ පළාත් සභාව විසුරුවා හැරීමෙන් අනතුරුවය. එම නිසා පළාත් සභාවේ මංත්‍රීවරුන්ගේ හා ඇමතිවරුන්ගේ ධුර හා බලතල අහෝසි වී ආණ්ඩුකාරවරයා වෙත බලතල පැවරේ. පළාත් සභා ඡන්ද විමසීම් පනතට 2017 වසරේදී එක් කරන ලද සංශෝධනයක් මගින් මැතිවරණ ක්‍රමයේ විශාල වෙනස්කමක් සිදු කරන ලදී. ඒ අනුව එතෙක් පැවති සමානුපාතික නියෝජන ක්‍රමය වෙනස් කර කොට්ඨාශ හා සමානුපාතික යන මිශ්‍ර ක්‍රමයකට සභිකයන් තෝරාගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම හා 25 % ක කාන්තා නියෝජනය අනිවාර්ය කිරීම මෙම සංශෝධණ මගින් සිදුකරන ලදී.

# පළාත් පාලන මැතිවරණය

ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභා යන පළාත් පාලන ආයතන සඳහා සභිකයින් තෝරාපත්කරනු ලබන්නේ පළාත් පාලන මැතිවරණය මගින්ය. පළාත් පාලන මැතිවරණයක දිනය තීරණ කරනු ලබන්නේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින්ය. ශ්‍රී ලංකාවේ වැඩිම මහජන නියෝජිතයින් සංඛ්‍යාවක් පත්වනු ලබන්නේ මෙම පළාත් පාලන මැතිවරණ තුලිනි. මෙම ඡන්ද විමසීම් මගින් සියලුම පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයින් 8436 ක් තෝරාපත් කරනු ලැබේ.

2014 හා 2017 වසරවලදී පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට සිදුකරන ලද සංශෝධන මගින් පළාත් පාලන මැතිවරණය මුලුමනින්ම වෙනස් විය. ඒ අනුව වත්මන් මැතිවරණ ක්‍රමය යටතේ එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා මුලු සභික සංඛ්‍යාවෙන් 60 % ක් කොට්ඨාශ තුලින් පත්වන අතර ඉතිරි 40 % පත්වන්නේ සමානුපාතික ක්‍රමයටය, එයට අමතරව එක් එක් පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සභිකයන්ගෙන් සියයට විසිපහකට නොඅඩු වූ ප්‍රමාණයක් කාන්තා සභිකයන් විය යුතු ය යන ප්‍රතිපාදනයද, පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සේවය කරන හෝ වසරක් ඇතුලත සේවය කර ඇති ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධාරීන්ට මැතිවරණයේදී අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම තහනම් කර තිබීම මෙම ඡන්ද විමසීම් පනතට සිදුකරන ලද සුවිශේෂී සංශෝධනයන්ය

# ජනමත විචාරණය

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව ජනමත විචාරණයක් පැවැත්වීම අවශ්‍යතා කිහිපයක් පවති.

1. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදි අණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 1,2,3,6,7,8,9,10,11 යන ව්‍යස්ථාවල සඳහන් විධිවිධාන සංශෝධනය කිරීම හෝ එකී ව්‍යවස්ථාවල සඳහන් කරණු වලට අනුකූල නොවන (පටගැනි වන) සංශෝධන වලදී පාර්ලිමේන්තවේ 2/3 ඡන්දයට අමතරව ජනමත විචාරණයක්ද පැවැත්විය යුතුය.

2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයකට පටහැනි වන්නා වු යම් පනතක් සම්මත කරගැනීම සඳහා.

3. ජනාධිපතිවරයාගේ මතය අනුව ජාතික වැදගත් කමකින් යුතුයයි සලකන්නා වු කරුණක් සම්මත කරගැනීම සඳහා.

4. පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද පනත් කෙටුම්පතක්(ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොවන) ජනාධිපතිවරයාට ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කල හැකිය.

මෙම අවශ්‍යතා සඳහා ජනමත විචාරණයක් පැවැත්විය හැකි අතර එයද මැතිවරණ කොමිසම මගින් පවත්වනු ලබයි. මෙහිදී ශ්‍රී ලංකාව පුරා එකම දිනයක මැතිවරණය පැවැත්විය යුතුය. මෙය ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය සෘජුවම ක්‍රියාත්මක කරන අවස්ථාවක් ලෙස දැක්විය හැකිය.

ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ ජනමත විචාරණ පවත්වා ඇත්තේ එකම අවස්ථාවක පමණි. එයද පවත්වා ඇත්තේ පාර්ලිමේන්තු මැතිවරණයක් කල්දැමීම සඳහා ජනතා අනුමැතිය ලබාගැනීම සඳහාය.

# IV. මැතිවරණයක පාර්ශවකරුවෝ

# IV. මැතිවරණායක පාර්ශවකරුවෝ

මැතිරවරණායක යනු එක් ආයතනයක් විසින් සිදුකරන ලබන ක්‍රියාවලියක් නොවේ. ඒ සඳහා සමස්ථ රටම විවිධ ආකාරයෙන් දායකත්වයන් දක්වයි. මේ අතරින් මැතිවරණායකදී ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන පාර්ශවකරුවන් කිහිපදෙනෙකු ගේ වගකීම් හා සුදුසුකම් මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කරමු.

## දේශපාලන පක්ෂ

මැතිවරණායකදී අපේක්ෂකයන් ඉදිරිපත් කල හැක්කේ පිළිගත් දේශපාලන පක්ෂවලට හා ස්වාධින කණ්ඩායම්වලටය. මැතිවරණායකදී සිය අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන දේශපාලන පක්ෂ මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචිය ලබාගත යුතුය. එකී ලියාපදිංචියේදී නම මෙන්ම පක්ෂ ලාංඡනය ද ලබාගත යුතුය. එවැනි දේශපාලන පක්ෂ “පිලිගත් දේශපාලන පක්ෂ” යනුවෙන් හදුන්වනු ලැබේ. මේ වන විට මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශාපාලන පක්ෂ 70ක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. මැතිවරණායකදී මෙම දේශපාලන පක්ෂ විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියක් මැතිවරණ කොමිෂම විසින් 2018 ජනවාරි 5 වන දින අංක 2052/35 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් හදුන්වාදී ඇත.

## අපේක්ෂකයින්

මැතිවරණායකදී ඡන්දය ඉල්ලා සිටින්නේ අපේක්ෂකයින්ය. අපේක්ෂකයින්ට මැතිවරණායකදී ඉදිරිපත් වීම සඳහා මැතිවරණ කොමිසම වෙත නාම යෝජනා කල යුතුය. එසේ නාම යෝජනා කල හැක්කේ පිලිගත් දේශපාලන පක්ෂවලින් හෝ ස්වාධින කණ්ඩායම් වලින් පමණි. එසේ මැතිවරණායක් සඳහා ඉරිපත් වන අපේක්ෂකයින්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම් මැතිවරණාය අනුව වෙනස් වේ. විශේෂයෙන්ම ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ජනධිපති මැතිවරණ පනත, පර්ලිමේන්තු මැතිවරණ පනත හා පළාත් පාලන ඡන්දවිමසීම් ආඥා පනත යන නීති වල මේ පිළිබදව පැහදිලි කිරීම් දක්නට ලැබේ, පොදුවේ ගත්කල-

### අපේක්ෂත්වය ලැබීමට සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
- වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම(ජනාධිපති අපේක්ෂකයකු සඳහා අවම වයස අවුරුදු 35 වේ)

## අපේක්ෂකත්ව ලැබීමට නුසුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවන තැනැත්තෙක්
- වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙක්
- අධිකරණ නිලධරයකු
- සන්නද්ධ හමුදාවල සාමාජිකයකු
- පොලිස් නිලධාරියකු
- ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක රජයේ නිලධාරියකු
- යම් රාජ්‍ය සංස්ථාවක නිලධාරියකු
- සිහිවිකල් පුද්ගලකු
- වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු
- මාස 12කට වැඩි කාලයක සිරදඬුවමක් සිටීම හෝ මරණීය දණ්ඩනය ලැබ එකී දඬුවම වෙනුවට සිරදඬුවම් ලබමින් සිටින පුද්ගලයකු
- යම් විනිශ්චයාධිකරණයක් විසින් මැතිවරණ වරදක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා ඉදිරිපත්වීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන්ගැනීමට නුසුදුස්සෙක් ලෙස තීරණය කල තැනැත්තෙකු
- අපරාධ වරදකට මාස තුනකට වඩා වැඩිකාලයක් සිරදඬු විදිමින් සිටීම හෝ එය අවසන් වී වසර පහකට වඩා අඩු කාලයක් ගතවීම
- එක් නාමයෝජනා පත්‍රයකට වැඩි ගනනක නම ඇතුලත් වීම

# ඡන්ද දායකයින්

මැතිවරණයක අත්‍යවශ්‍යම පාර්ශවයක් වන්නේ ඡන්ද දායකයන්ය. ඡන්දය දායකයකු වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතු අතර මැතිවරණයට අදාල වර්ෂයේ ඡන්ද නාමලේඛණයට සිය නම ඇතුලත්ව තිබිය යුතුය.

ඡන්දය භාවිතා කිරීමට නුසුදුසුකම්

- සිහිවිකල තැනැත්තකු ලෙස අධිකරණයක් මගින් තීරණයකර තිබීම,
- මැතිවරණ දූෂණ වරදකට වරදකරු වී ඇත්නම් වරදකරු ලෙස තීරණය කල දින සිට වසර 7ක් ඉක්මවා නොතිවීම,
- අල්ලස් පනත යටතේ වු වරදකට වරදකරු වී නම් වරදකරු කල දින සිට වසර 7 ක් ඉක්මවා නොතිබීම,
- මැතිවරණ පනත යටතේ වු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වී එහෙත් එහෙත් වරදකරු වීමේ දිනයේ සිට වර්ෂ 3ක් ඉක්මවා නොතිබීම,
- ප්‍රජා අයිතිය අහෝසිකල පුද්ගලයකු එකී කාලය ඉක්මගොස් නොමැති වීම,
- දණ්ඩ නීති සංග්‍රහය යටත් වු බරපතල වරදකට වරදකරු වී ඇතිවිටක වරදකරු ලෙස තිරණය කල දින සිට වර්ෂ 7ක් ඉක්මවා නොමැති වීම,
- ජනාධිපති කොමිෂන් සභාවක් විසින් එයට අගෞරව කිරීමේ වරදකට වරදකරු කල පුද්ගලයකු එසේ වරදකරු ලෙස තීරණය කල දින සිට වර්ෂ 7 ක් ඉක්මවා නොමැති වීම,

යන කරුණු මත ඔහුට අදාල මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය අහිමිව යයි.

# මැතිවරණ කොමිෂන් සභාව

ජනාධිපතිවරණය, ජනමත විචාරණය, පළාත් සභා ඡන්ද විමසීම හා පලාත් පාලන ඡන්ද විමසීම් පැවැත්වීමේ බලය ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාවටය. කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකු සිටින අතර ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිතුමා විසින් වසර 5ක කාලයක් සඳහා පත් කරනු ලබයි. එම කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන කොමසාරිස් ජෙනරාල් වරයා ඇතුලු මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය කාර්යාල 26ක නිළධාරීන් හා මැතිවරණ රාජකාරි සඳහා අනුයුත්ක කරගනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් මැතිවරණ කටයුතු මෙහෙයවීම සිදුකරනු ලබයි.

# පොලිසිය

මැතිවරණයකදී මැතිවරණ රාජකාරියේ නියුතු නිලධාරීන්ගේ අපේක්ෂකයින්ගේ හා මහජනතාවගේ ආරක්ෂාව පැවරෙන්නේ පොලිසියටයි. මැතිවරණයට අදාලව සිදුවන ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීම හා නීතිය ක්‍රියාත්මක කිරීම පමණක් නොව ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 104(ඇ) ව්‍යවස්ථාවෙන් දක්වා සිටින්නේ මැතිවරණයේ රාජකාරි සඳහා මැතිවරණ කොමිසම විසින් ඉල්ලා සිටිනු ලබන පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් පොලිස්පති වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදිය යුතු බවයි. එසේ කොමිෂන් සභාව වෙත ලබාදුන් පොලිස් නිලධාරීන් කොමිෂන් සභාවේ විධානය මත ක්‍රියාත්මක විය යුතු බව එකී ව්‍යවස්ථාවේ දක්වා ඇත.

# ජනමාධ්‍ය

දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් පිළිබඳව ප්‍රචාරය ලබාදීම මෙන්ම මැතිවරණයට අදාල මැතිවරණ කොමිෂන් සභාවේ හා රජයේ නිවේදන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට සිදුකරන්නේ ජනමාධ්‍ය මගිනි. මැතිවරණයක තීරණය කෙරෙහි මෙන්ම සමබිමක සියලු දේශපාලන පක්ෂ තරග කිරීමේ අවශ්‍යතාව තහවුරු කිරීම සඳහා ජනමාධ්‍යයෙහි අපක්ෂපාතී හැසිරීම ඉතාමත්ම වැදගත් වේ. ඒ නිසාම මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ සමයකදී මාධ්‍ය විසින් අනුගමනය කල යුතු උපමාන ගැසට් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. එම උපමානයන්ට අනුකූලව මැතිවරණයට අදාල පුවත් පලකිරීම සෑම මාධ්‍යයකම වගකීමකි. එමගින් අපේක්ෂා කරනු ලබන්නේ මැතිවරණ සමයකදී ජනමාධ්‍යය සමබරව හා අපක්ෂපාතීව සිය මාධ්‍යය මෙහෙයුම සිදුකල යුතු බවයි.

# රාජ්‍ය නිලධාරීන්

මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ මෙහෙයුම් කටයුතු සඳහා දායකත්වය දක්වන්නේ රජයේ නිලධාරීන්ය. එමෙන්ම මැතිවරණයක් පවතින විට රජයේ සේවාවන් අඩාල නොවන පරිදී පවත්වාගෙන යාමේ වගකීම රජයේ නිලධාරීන් සතුය. විශේෂයෙන්ම රජයේ සම්පත් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීමෙන් වැළැක්වීමට පියවර ගැනීමේ වගකීමක් රාජ්‍ය නිලධාරීන්ට ඇත. මේ නිසාම මාණ්ඩලික නිලධාරීන්ට ඡන්දය භාවිතා කිරීම හැර වෙනත් දේශපාලන කටයුතු වල යෙදීම නීති මගින්ම තහනම් කර ඇත. එසේම මැතිවරණයක් ප්‍රකාශයට පත් කල පසු රජයේ නිලධාරීන් ස්ථානමාරු කිරීම උසස් කිරීම හා බඳවා ගැනීම සිදුකල යුත්තේ මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය මතය.

# ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින්

ශ්‍රී ලංකාවේ කිසිදු මැතිවරණ නීතියක මැතිවරණ නිරීක්ෂකයින් සම්බන්ධයෙන් විශේෂ සඳහනක් නැත. නමුත් 1990 දශකයේ සිට නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීමේ කාර්යය සඳහා මැතිවරණ නිරීක්ෂකයින් විශාල කාර්යය භාරයක් සිදු කර ඇත. මේ වන විට එකී මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය(පැෆ්රල්) සංවිධානයට හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට(සීඑම්ඊවී) ඡන්ද මධ්‍යස්ථානය තුල රැඳී සිටිමින් මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය හිමිවී ඇත. මැතිරවරණ නිරීක්ෂණයේ තවත් පියවරක් ඉදිරියට තබමින් 2015 වසරේ පැවති ජනාධිපතිවරණයේ සිට මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වල මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය ලත් සාමාජිකයන්ට ඡන්ද ගනන් කිරීමේ මධ්‍යස්ථාවල රැඳී සිටිමින් මැතිවරණ නිරීක්ෂණය කිරීමේ අවස්ථාවද සලසා ඇත.

මෙම ස්ථානයේ රැඳී සිටිමින් නිරීක්ෂණ කටයුතු සිදුකරන මැතිරවණ නිරීක්ෂකයින් තම නිරීක්ෂණ සංවිධානවලට සිය නිරීක්ෂණ වාර්තා ලබාදීමට අමතරව මැතිවරණ කොමිෂන් සභාවෙ වෙතද වාර්තාවක් සැපයීමට බැදී සිටියි.

මේ වන විට මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් 8ක් පමණ ක්‍රියාත්මක වේ.

# V. මැතිවරණයක ක්‍රියාවලිය

# V. මැතිවරණායක ක්‍රියාවලිය

ශ්‍රී ලංකාවේ එක් එක් මැතිවරණායන් සිදුවන ආකාරයන් පිලිබඳව සරල අවබෝධයක් ලබාදීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. අධ්‍යයනයේ පහසුව සඳහා මැතිවරණ ක්‍රියාවලියක් අවධින් නැතහොත් අවස්ථාවන් 3ක ට බෙදිය හැකිය. එනම්-

1. පූර්ව මැතිවරණ සමය
2. මැතිවරණ දිනය
3. පශ්තාත් මැතිවරණ සමය

# පූර්ව මැතිවරණ සමය

පූර්ව මැතිවරණ සමය ආරම්භ වන්නේ මැතිවරණායක් පැවැත්වීම පිලිබඳව නිවේදනය නිකුත් කිරීමත් සමගය. මැතිවරණායක් පැවැත්වීම පිළිබඳ නිවේදනය නිකුත් කිරීමේ බලය මැතිවරණාය අනුව වෙනස් වේ. එසේම පූර්ව මැතිවරණ සමයක තවත් වැදගත් ක්‍රියාවන් වන්නේ නාමයෝජනා කාලය පිළිබඳ නිවේදනය කිරීම, නාමයෝජනා භාරගැනීම, මැතිවරණ දිනය නියම කිරීම, යන ක්‍රියාවන්ය.

## ජනාධිපතිවරණාය

- **<u>මැතිවරණාය පැවැත්වෙන බව තීරණාය කිරීම</u>**- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(3) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණායක් පැවැත්විය යුතු බවට තීරණාය කිරීමේ වගකීම පවතින්නේ බලයයේ සිටින ජනාධිපතිතුමාටය. සිය නිලකාලය අවසන්වීමට මාසයකට නොඅඩු හා මාස දෙකකට නොඅඩු කාලයකදී මෙම ජනාධිපතිවරණ පැවැත්වීම නිවේදනය කල යුතු අතර 31(3)(අ) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ තමන් නැවත තරග කිරීමට සූදානම් වන්නේ නම් සිය ප්‍රථම ධූරකාලය ආරම්භ වී අවරුදු හතරක් ඉකුත්වීමෙන් පසුව යම් අවස්ථාවකදී ජනාධිපතිවණාය පැවැත්විමේ නිවේදනය නිකුත් කල හැකි බවයි.
- **<u>නාමයෝජනා දිනය නියම කිරීම-</u>** ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ පනතෙහි 2වන වගන්තියට අනුව නාමයෝජනා දිනය හා ස්ථානය නියම කිරීමේ බලය මැතිවරණ කොමිසමට ඇත. ගැසට් පත්‍රයේ පලකරනු ලබන දනයේ සිට දින 16 හා 21 අතර කාලයක් තුල නාමයෝජනා ලබාගත යුතුය.

- **<u>ඡන්දය පැවැත්වෙන දිනය නියම කිරීම-</u>** ජනාධිපතිවරණ පනතේ 2(ආ) වගන්තියට අනුව මැතිවරන දිනය නිවේදනය කිරීමේ බලය පවතින්නේ ද මැතිවරණ කොමිසම වෙතය. ඒ අනුව නාමයෝජනා කිරීමේ දිනයේ සිට සති හතරත් සති හයත් අතර දිනයක මැතිවරණ දිනය නියම කල යුතුය.

## පාර්ලිමේන්තු මැතිවරණය

පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීම සඳහා පවතින පාර්ලිමේන්තුවේ වසර 5ක කාලය අවසන් විය යුතුය. නැතහොත් ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතුය. ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි අවස්ථාවන් 2ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවේ දක්වා ඇත. එනම්

1. පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමෙන් අවුරුදු හතර හමාරක් ගතවූ පසු සිය අභිමතය මත නිකුත් කරනු ලබන නිවේදනයක් මගින්.
2. පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන්ගේද ඇතුලු මුලු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 2/3ක බහුතර ඡන්දයෙන් සම්මත කරගන්නා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාවක් අනුව ජනාධිපතිතුමා විසින් සිදුකරනු ලබන නිවේදනයක් මගින්.

මෙම ආකාර දෙකෙන් කුමණ ආකාරයකට හෝ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන නිවේදනය මගින් පහත කරුණුද නිවේදනය කල යුතු බව 70(5) ව්‍යවස්ථාව දක්වා තිබේ. එනම්

- අභිනව පාර්ලිමේන්තුව රැස්වන දිනය- මෙම දිනය පාර්ලිමේන්තුව විසුරුවාහැරි දිනයෙන් පසු මාස තුනක නොවැඩි දිනයක් විය යුතුය.

එසේම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය දක්වා සිටින්නේ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ප්‍රකාශය සමගම පහත කරුණුද නිවේදනය කල යුතු බවයි.

- නාමයෝජනා කාලසීමාව- විසුරුවා හැරීමේ නිවේදනයේ සිට දින 19වන දිනයෙන් ආරම්භව එකී දිනයෙන් පසුව එලබෙන 17වන දිනයේ මධ්‍යහනයෙන් අවසන් විය යුතුය.
- ඡන්දය පවත්වන දිනය-නාමයෝජනා කාලසීමාව අවසන් වීමෙන් පසු සති පහත් සති හතත් අතර කාලසීමාවක දිනයක් නියම කල යුතුය.

# පළාත් සභා ඡන්ද විමසීම

පලාත් සභා මැතිවරණයක් පැවැත්වීම සඳහා පළාත් සභාවක වසර පහක කාලය නිමාවට පත් වීම හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආ)(8)(ඇ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවක් විසුරුවා හැරීමේ නිවේදනයක් නිකුත් කිරීම සිදු කල යුතුය.

**ඡන්ද විමසීම පවත්වන බව නිවේදනය කිරීම-** පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් සති 4ක් ඇතුලත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීම අදාල පළාත් සභා ඡන්ද විමසීම පවත්වන බවට නිවේදනය නිකුත් කල යුතුය.(2017 සංශෝධනයට අනුව).

**නාමයෝජනා දිනය තීරණය කිරීම-** අදාල දිස්ත්‍රික්කය සඳහා නාමයොජනා කාලසීමාව නිවේදනය කිරීමේ වගකීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සතු වන බව පලාත් සභා ඡන්ද විමසීමේ පනතේ 10 වන වගන්තිය දක්වා සිටියි. මේ සඳහා මැතිවරණ කොමිසම විසින් ඡන්ද විමසීම පවත්වන බවට වූ නිවේදනය නිකුත් කල දින සිට දින 14වන දින සිට 21 වන දින මධ්‍යහන 12 දක්වා කාලයක් සහිත නිවේදනයක් නාමයෝජනා ආකෘතියද සහිතව සිය කාර්යාලයේ ප්‍රදර්ශනය කල යුතුය.

**ඡන්ද විමසීම් දිනය නිවේදනය කිරීම-** පලාත් සභා ඡන්ද විමසීම් පනතේ 22(1) වගන්තියට අනුව පලාත් සභා මැතිවරණයක් පැවැත්වීම් දිනය නිවේදනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීවරයාටය. නාමයෝජනා කාලය අවසන් වීමෙන් පසු සති පහත් සති අටත් අතර කාලයක දී යෙදෙන සෙනසුරාදා දිනයක ඡන්දය පැවැත්විය යුතු බව පනතේ සඳහන්වේ. එකී නිවේදනය අදාල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් ගැසට් පත්‍රයේ පල කල යුතුය.

# පළාත් පාලන ඡන්ද විමසීම-

පළාත් පාලන ඡන්ද විමසීමක් ආරම්භ වන්නේ එකී පලාත් පාලන ආයතනවල නිලකාලය ආරම්භ වන දිනය විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකිරීමෙන් අනතුරුවය(පලාත් පාලන ඡන්ද විමසීම් පනතේ 25 වගන්තිය) ඒ අනුව එකී නිලකාලය ආරම්භ වීමට මාස 6ක කාල සීමාවක් තුල මැතිවරණය පැවැත්විය යුතුය.

**නාමයෝජනා කාලසීමාව පිළිබඳ නිවේදනය-** පාලත් පාලන ඡන්ද විමසීමට අදාලව නාමයෝජනා කාලසීමාව පිළිබඳ නිවේදනය නිකුත් කිරීමේ වගකීම පවතින්නේ අදාල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා වෙත බව පලාත් පාලන ඡන්ද විමසීම් පනතේ 26 වන වගන්තිය දක්වා සිටියි. ඔහු විසින් නිවේදනය නිකුත් කල දිනයේ සිට දින 14ත් 17ත් අතර කාලසීමාවක් මේ සඳහා නියම කල යුතු බව එකී වගන්තියේ තවදුරටත් සඳහන් වේ.

**මැතිවරණ දිනය පිළිබඳ නිවේදනය-** පලාත් පාලන මැතිවරණය සඳහා දිනය නියම කිරීමේ වගකීම පවතින්නේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීවරයාට බව පනතේ 38 වන වගන්තියේ දැක්වේ. ඒ අනුව ඔහු විසින් ඒ පිළිබඳව දැන්වීමක් නිකුත් කල යුතු අතර එහි.

- ඡන්දය පැවැත්වෙන දිනය (නිවේදනයෙන් සති 5ක් සති 7ත් අතර දිනයක්)
- තරගවදින දේශපාලන පක්ෂ/ස්වාධින කණ්ඩායම් හා ඡන්ද ලකුණු
- ඡන්ද මධ්‍යස්ථාන සඳහන් කල යුතුය

ඒ අනුව පූර්ව මැතිවරණ සමයට අදාලව සිදුවන වැදගත්ම සිදුවීම් වනුයේ මැතිවරණයක් පැවැත්වෙන බව ප්‍රකාශ කිරීම, නාමයෝජනා කැඳවීම හා මැතිවරණ දිනය ප්‍රකාශයට පත් කිරීමයි.

එසේම පූර්ව මැතිවරණ සමයේ දී ඡන්ද දායකයන්ට දැනෙන වැදගත්ම ක්‍රියාවලිය වන්නේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුවීමයි.(මැතිවරණ ප්‍රචාරණය පිළිබඳ පරිච්ඡේදයේදී මේ පිළිබඳ කරුණු විස්තර කරනු ලැබේ).

එමෙන්ම පූර්ව මැතිවරණ ක්‍රියාවක් නොවූවද එකී සමයේ සිදුවන වැදගත් ක්‍රියාවක් වන්නේ තැපැල් ඡන්දය විමසීම සිදුවීමයි. තැපැල් ඡන්දය භාවිතා කිරීම සඳහා තැපැල් ඡන්දය අයදුම් කල යුතුය. තැපැල් ඡන්දය අයදුම් කිරීමේ අයිතිය ඇත්තේ මැතිවරණ රාජකාරී සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන රාජ්‍ය සේවාකයන්, පොලිස් හා සන්නද්ධ සේවා සාමාජිකයින් හා රජයේ ප්‍රවාහන සේවාවන්ට අදාල සේවකයන්ටය.

# මැතිවරණ දිනය

මැතිවරණ දිනයේදී කලින් නිවේදනය කල ඡන්ද මධ්‍යස්ථාවල ඡන්දය පෙරවරු 7 සිට පස්වරු 4 දක්වා කාලයක ඡන්දය පැවැත්වේ. මෙකී ඡන්දය පැවැත්වෙන දිනයට අදාලව පවතින නීතිමය ප්‍රතිපාදන කිහිපයක් සාකච්ඡා කරමු .

## ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළු වීමට බලයලත් පුද්ගලයන්

- අදාළ ඡන්ද හිමියන්
- ඡන්ද පොළ නිළධාරින්
- බලය ලත් ඡන්ද පොළ නියෝජිතයන්
- සංචාරක මැතිවරණ නිළධාරින් (සහකාර තේරීම්භාර නිළධාරීන්)
- අපේක්ෂකයින් (එක්වරකට එක් අපේක්ෂකයකු පමණි)
- තරග කරන දේශපාලන පක්ෂ ලේකම් හෝ බලයලත් නියෝජිත
- අවසරලත් මැතිවරණ නිරීක්ෂකයින්

## ඡන්ද පොලවල ප්‍රදර්ශනය කල යුතු දැන්වීම්

සෑම ඡන්ද පොලකම අදාල ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පහත දැන්වීම් ප්‍රදර්ශන කලයුතය.

- ඡන්දය දෙන ආකාරය පිළිබඳව ඡන්ද දායකයන්ට උපදෙස් දෙන දැන්වීම.
- එක් එක් අපේක්ෂකයන්ගේ නම් හා ඔවුන්ට වෙන්කරන ලද ලකුණු ඇතුලත් දැන්විම.
- බලයලත් ඡන්දපොල නියෝජිතයින්ට ස්ටිකර් ඇලවීමට ඉඩ ලබාදෙනු ලැබේ.

## ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ස්ථානාධිපතිගේ කාර්යයන්

- ඡන්ද පත්‍රිකා, නිළ මුද්‍රාව, නිළ ලකුණ, ඡන්ද හිමිගේ නාම ලේඛනය ඡන්ද පොළට පැමිණ සිටින අයට පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීම.

## ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයන්ට භාරදීමේ පියවරයන්

- ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්ද දායකයාගේ නම සහ අංකය හඬනගා කියවිය යුතුය.
- ඡන්ද දායකයාගේ අනන්‍යනතාවය තහවුරුකරගත යුතුය.
- ඡන්දදායකයාගේ වම් අතේ සුළැගිල්ල මත නියමිත තීන්ත ආලේප කිරීම.

- ඡන්ද දායකයාගේ අංකය ඡන්ද පත්‍රිකා පොතෙහි උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කළ යුතුය.
- ඡන්ද පත්‍රිකාව නිළ ලකුණින් මුද්‍රා තැබිය යුතුය (තෙරපීම හෝ සිදුරු කිරීම).
- අදාළ ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකාවක් නිකුත්කළ බව දැක්වීම පිණිස ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදිය යුතුය (මෙහිදී ඡන්ද පත්‍රිකාවේ අංකය නොයෙදිය යුතුයි).
- ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දිය යුතුය.

## ඡන්ද විමසීම අවසන්වූ විට කාර්යය

ස්ථානාධිපතිවරයා නියෝජිතයන් ඉදිරිපිට දී ඡන්ද පෙට්ටිය වසා දමා තමාගේ මුද්‍රාවෙන් මුද්‍රා තැබිය යුතු අතර නියෝජිතයන්ට අවශ්‍යනම් තමන්ගේ මුද්‍රා තැබීමට අවස්ථාව දිය යුතුය. එමෙන්ම මැතිවරණ නිලධාරීන්ගේ වාර්තා සකස් කිරීම මෙන්ම ඡන්ද විමසීම පැවැත්වූ ආකාරය පිළිදව දේශපාලන පක්ෂයන්හි ඡන්දපොල නියෝජිතයින්ගේ හා පොලිස් නිලධාරීන්ගේ මෙන්ම ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින්ගේ නිරීක්ෂණ වාර්තා ලබාගැනීමද ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලධාරී විසින් සිදුකරනු ලබයි. මෙම සියලු කටයුතු අවසානයේ ඡන්ද පෙට්ටිය නියමිත ගනන් කිරීමේ මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහනය කර අදාල ගනන් කිරීමේ නිලධාරීන්ට ඡන්ද පෙට්ටිය හා වාර්තා භාරදීම සිදුකරනු ලබයි.

# පශ්චාත් මැතිවරණ සමය

ඡන්ද විමසීම අවසන් වූ පසුව සිදුකරන වැදගත්ම ක්‍රියාවලිය වන්නේ ඡන්දය ගනන් කිරීමේ ක්‍රියාවලියයි. එය අවසන් වූ පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රතිඵල පසුව ගැසට් පත්‍රයේ පලකරනු ලැබේ.

ඡන්ද විමසීම පැවත්වාගෙන ගිය ආකාරය පිළිබඳව හෝ ඡන්ද ගනන් කිරීම පිළිබඳව යම් නීතිමය ගැටලුවක් පවතින අපෙක්ෂකයකුට දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට එකී මැතිවරණ ප්‍රතිඵලයට එරෙහිව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිපාදන සෑම මැතිවරණ පනතකම දක්වා ඇත. එහිදී ඡන්දය යලි ගනන් කිරීම මෙන්ම යලි ඡන්දයක් පැවැත්වීම පිලිබද නියෝගයන්ද නිකුත් කිරීමේ බලය අධිකරණයට ඇත.

## මැතිවරණ කොමිසමට ඡන්ද මධ්‍යස්ථානයක් ශූන්‍ය කල හැකි අවස්ථා

- නියමිත වේලාවට අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකිවීම
- ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම
- ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම
- ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොළෙන් පිටතට පළවා හැරීම
- මාර්ගයේ යම් අවහිරතාවක් නිසා ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිණීමට නොහැකි ඩිම
- ඡන්ද පොළේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොළේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම
- කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම
- කිසියම් ඡන්දපොළක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම

මෙවැනි සිදුවීමක් යම් ඡන්ද මධ්‍යස්ථානයක සිදු වුවහොත් ඒ පිලිබඳව අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලිධාරී විසින් ඒ බව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කල යුතු අතර කොමිසම විසින් පරීක්ෂණයක් සිදු කර අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය ශූන්‍ය කරනු ලැබේ.

මෙම ශූන්‍ය කිරීමේ කාර්යය සඳහා සලකා බලනු ලබන වෙනත් කරුණු අතර පහත වාර්තාවන්ද සැලකිල්ලට ගනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලධාරී වාර්තාව
- සංචාරක සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ වාර්තා
- ඡන්ද මධ්‍යස්ථානයේ ආරක්ෂාව භාරව සිටි නිලධාරීගේ වාර්තාව

- සංචාරක පොලිස් නිලධාරීන්ගේ වාර්තා
- දේශපාලන පක්ෂ වෙනුවෙන් සහභාගී වූ ඡන්දපොල නියෝජිතයින්ගේ වාර්තා
- ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින්ගේ වාර්තා

# VI. මැතිවරණ ප්‍රචාරණය

# VI. මැතිවරණ ප්‍රචාරණය

මැතිවරණයන් සඳහා නාමයෝජනා භාරදීමෙන් අනතුරුව සියළුම අපේක්ෂකයන් තම ජයග්‍රහනය පතා ප්‍රචාරක කටයුතු සිදුකරනු ලබයි. එහි දී තම පක්ෂ ලාංජනය හා අංකය හා සිය රූපය වඩඩාත් ජනතාව තුල ප්‍රචලිත කිරීමට සියළු අපේක්ෂකයන් පියවර ගනියි. ඒ සඳහා පවත්වන ප්‍රචාරක ක්‍රියාවලින් පිළිබඳ නීති තත්වයක් ජනාධිපතිවරණ පනත,පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත හා පළාත් පාලන ඡන්ද විමසීම් පනතේ දක්වා ඇත. මෙම පනත් වල ප්‍රතිපාදන අතර යම් යම් වෙනස්කම් දක්නට ලැබෙන අතර පොදුවේ මැතිවරණ ප්‍රචාරය සම්බන්ධයෙන් පවතින නීතිමය ප්‍රතිපාදන පහත දැක්වේ.

## පෝස්ටර් දැන්විම හා අත් පත්‍රිකා

නාම යෝජනා භාරදුන් දිනයේ සිට ඡන්ද විමසීමේ දිනයෙන් පසු දිනය දක්වා පෝස්ටර් දැන්වීම් හා අත් පත්‍රිකා ප්‍රදර්ශනය කල හැකි ස්ථාන වන්නේ-

1. අපේක්ෂකයා ගමන් කරන කරන වාහනය(අපේක්ෂකයා වාහනයේ සිටින විට)
2. ඡන්ද ප්‍රචාරක රැස්වීම් පවත්වන ස්ථාන
3. නිවේදිත ප්‍රචාරක කාර්යාල පරිශ්‍රයන් තුල

මේ හැර මහජනයාට ඇතුළුවීමට අයිතියක් ඇති කිසිදු ස්ථානයක හෝ වාහනයක මහා මාර්ගයක, අපේක්ෂකයන්ගේ ඡායාරූපයක්, ඡන්ද ලකුණ හෝ චිත්‍රයක් හෝ අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීමේ ඉඩකඩ වැඩිකිරීමේ කාර්යය සඳහා වන දැන්වීමක් ප්‍රදර්ශනය නොකල යුතුය.

එමෙන්ම අපේක්ෂකයකු ප්‍රවාහනය සඳහා භාවිතාකරන වාහනයක හාර වෙනත් කිසිදු පොදු හෝ පෞද්ගලික කිසිම ස්ථානයක අපේක්ෂකයකු තෝරාපත් කරගැනීම් ඉඩකඩ වැඩිකිරීමේ අපේක්ෂාවෙන් ප්‍රදර්ශනය කරන කිසිදු කොඩියක් හෝ පතාකයක් ප්‍රදර්ශනය කිරීම තහනම් වේ.

## පුවත්පත්වල අසත්‍ය වාර්ථා පල කිරීම

ඡන්ද විමසීම ඉදිරිපත් වී ඇති යම් අපේක්ෂකයකුගේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇතවිය හැකි ආකාරයට ඔවුගේ කියමන් හෝ කටයුත්තක් පිළිබඳව අසත්‍ය ප්‍රවෘත්තියක් යම් පුවත්පත හෝ වාර ප්‍රකාශනයක පලකිරීම වරදක් වේ.

## පෙරහැර පැවැත්වීම

මැතිවරණයකට නාමයෝජනා භාරදුන් දින සිට ඡන්ද විමසීමේ දිනයට පසු දිනය දක්වා පසු එලඹෙන දින දක්වා කාලයක් තුල මැයිපෙලපාලි, සංස්කෘතික හෝ ආගමික ස්වරූපයේ පෙරහැර හැරුනවිට දේශපාලන ප්‍රචාරක අංගයක් ලෙස පෙරහැර යාම තහනම් වේ. එකී පෙරහැර සංවිධානය කිරීම මෙහෙයවීම හෝ එකී පෙරහැරක සාමාජිකයකු ලෙස සහභාගී වීමද වරදක් වේ.

## ආගමික ස්ථාවල මැතිවරණ ප්‍රචාරය සිදු කිරීම

ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් තෝරාපත් කරගැනීමට අනුබල දීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවැත්වීම හෝ පැවැත්වීමට අනුබල දීම වරදකි.

## මැතිවරණ ප්‍රචාරක කාර්යාල

මැතිවරණය ප්‍රචාරණ කටයුතු සඳහා ප්‍රචාරක කාර්යාල පිහිටුවීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් විධිමත් අවසරයක් ලබාගත යුතු අතර එසේ අවසර ලබාගත් මැතිවරණ ප්‍රචාරක කාර්යාල නිවේදිත ප්‍රචාරක කාර්යාල ලෙස හදුන්වනු ලැබේ.

ඒ අනුව සෑම පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සඳහාම මැතිවරණ බල ප්‍රදේශයක් සඳහා එක් මධ්‍ය ප්‍රචාරක කාර්යාලයක්ද ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශයක් සඳහා එක් ප්‍රචාරක කාර්යාලයක්ද පවත්වාගෙන යා හැකිය. මෙයට අමතරව අපේක්ෂකයකු සාමාන්‍යයෙන් පදිංචිව සිටින නිවසේ කාර්යාලයක් පවත්වාගෙන යා හැකිය. මෙම කාර්යාල තුල අපෙක්ෂකයාගේ හෝ දේශපාලන පක්ෂවල කටවුට් පෝස්ටර් වැනි ප්‍රචාරක කාර්යයන් සිදුකල හැකිය.

මැතිවරණ දිනයට පැය 48 ටකට පෙර මැතිවරණ ප්‍රචාරක කටයුතු නිමකල යුතු බැවින් එම කාලය තුල පවත්වාගෙන යා හැකිවන්නේ එක් මධ්‍ය ප්‍රචාරක කාර්යාලයක් හා අපේක්ෂකයාගේ නිවසේ කාර්යාලය පමණි.

## මැතිවරණ ප්‍රචාරක රැස්වීම්

මැතිවරණයක ප්‍රචාරක රැස්වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විධිවිධාන දක්වා ඇත. ඒ අනුව මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් පවත්වන ස්ථානයේ සැරසිලි කිරීම අදාල රැස්වීම ආරම්භ කිරීමට පැය 18 ක කාලයක් ඇතුලත සිදු කල යුතු අතර රැස්වීම නිමවී පැය 12ක් ඇතුලත සැරසිලි ඉවත් කරගත යුතුය. සැරසිලි සිදුකල හැක්කේ රැස්වීම පවත්වන ස්ථානයේ සිට මීටර් 250ක් දක්වා පමණි.

මෙම රැස්වීම් පැවැත්වීම හා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අදාල පොලිස් ස්ථානයෙන් බලපත්‍ර ලබාගත යුතුය.

## ගෙයින්ගෙට ගොස් සිදුකරන මැතිවරණ ප්‍රචාර

ගෙයින් ගෙට ගොස් සිදුකරන මැතිවරන ප්‍රචාර පිළිබඳවද මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳ විධිමත්භාවයන් දක්වා ඇත. ඒ අනුව එවැනි ප්‍රචාරක කණ්ඩායමක් සඳහා උපරිම වශයෙන් සහභාගී විය හැකි මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඒ මැතිවරණ ආසන්නයේදී දේශපාලන පක්ෂ නිත්‍ය නියෝජිත කණ්ඩායම් හා පොලිසිය සමග සාකච්ඡා කර තීරණය කරනු ලබන අතර ඒ පිලිබඳව ප්‍රචාරයක් ද ලබාදෙනු ලැබේ. එමෙන්ම එහිදී සංගීත කණ්ඩායම්.සංගීත භාණ්ඩ හෝ ශබ්ද විකාශන යන්ත්‍ර යොදාගත නොහැක.

## මැතිවරණ ප්‍රචාරක කටයුතු අධීක්ෂණය

මැතිවරණයකදී ප්‍රචාරක කටයුතු පිළිබඳ සුපරික්ෂාවෙන් සිටීම විශේෂයෙන්ම නීත්‍යනුකූල ප්‍රචාරක කටයුතු බාධාවකින් තොරව සිදුකිරීමට අවශ්‍ය රැකවරණය සැලසීම වෙන්ම නීතිවිරෝධී ප්‍රචාරක කටයුතු සිදුකරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීම හා එකී ප්‍රචාරක ද්‍රව්‍ය ඉවත් කිරීමේ නීතිමය වගකීම් පැවරී ඇත්තේ පොලිස් දෙපාර්තමේන්තුවටය. මේ සඳහා පොලිසිය පැමිණිල්ලක් ලැබී තිබීම අත්‍යවශ්‍ය නොවේ පොලිසියට එවැනි නීති විරෝධී ක්‍රියා පිළිබඳව දැනුවත්නම් ඒවා ඉවත් කිරීම හා වැලැක්වීමේ වගකීම ඇත.

# මාධ්‍ය උපමාන

මැතිවරණ කාලය තුල එනම් මැතිවරණය පිළිබඳව මැතිවරන කොමිෂන් සභාව දැනුම්දීම සිදුකල දින සිට මැතිවරණය පවත්වන දිනය දක්වා කාලය තුල මුද්‍රිත හා විද්‍යුත් මාධය සමබරව කටයුතු කල යුතු ආකාරය පිළිබඳව උපමාන නියම කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවසථාවේ 104(අ)(5) ව්‍යවස්ථාව මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලබන මාධ්‍ය උපමාන ගැසට් පත්‍රයේ පලකල යුතුය.

# රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම

මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්-

1. ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම;

2. ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම, තහනම් කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(4) ව්‍යවස්ථාව මගින් මැතිවරණ කොමිෂන් සභාවට පවරා ඇත.

එකී බලතල භාවිතා කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණයක් ප්‍රකාශයට පත් කල විටක අති විශේෂ ගැසට් පත්‍රය මගින් “ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන” පනවා ඇත.

මෙම විධානයක් කඩ කිරීමට වරදකරුවන අයෙකුට රුපියල් ලක්‍ෂයක් දක්වා දඩ හා වසර තුනක් දක්වා බණ්ධනාගත කිරීමකින් දඬුවම් කල හැකිය.

# සීමිත දේශපාලන අයිතිවාසිකම් සහිත නිළධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතවීම

ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට ඡන්දය දීමේ අයිතිය උරගා බැලීමට හැර රැස්වීම්වලට සහභාගිවීම හා ඕනෑම අපේක්ෂකයෙකුගේ හෝ පක්ෂයක ප්‍රචාරක කටයුතු සමග ක්‍රියාකාරීව සම්බන්ධවීම තහනම් කර ඇත.

එමෙන්ම සාම නිළධාරීන් සන්නද්ධ සේවා නිළධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ද මෙම සීමිත මැතිවරණ අයිතිවාසිකම් සහිත නිළධාරීන් ගනයට වැටේ. එවැනි අයෙකු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදකි.

# VII. බහුලව සිදුවන මැතිවරණ නීති උල්ලංඝනයන්

# VII. බහුලව සිදුවන මැතිවරණ නීති උල්ලංඝනයන්

සෑම මැතිවරණයකදී බහුලව සිදුවන මැතිවරණ නීති උල්ලංඝණයන් කිහිපයක් පැහැදිලිව හදුනාගත හැකිය.

## පොස්ටර්/කටවුට් ප්‍රදර්ශනය

ඡන්ද ලකුණක්,අංකයක්, අපේක්ෂකයකුගේ රුවක් සහිත මැතිවරණ පෝස්ටරයක් මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක, අපේක්ෂකයකු ප්‍රවාහනය කරන වාහනයක, මැතිවරණ රැලියක් පැවැත්වෙන ස්ථානයේ හෝ අපේක්ෂකයාගේ නිවසේ හැර වෙනත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීම මැතිවරණ නීති උල්ලංඝනයකි.

## බලපත්‍ර රහිතව ශබ්ද විකාශන භාවිතය

මැතිවරණ සමයේදී බහුලව සිදුවන නීති උල්ලංඝනයකි. බොහෝවිට අපේක්ෂකයින් ප්‍රවරධනය කිරීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර සවිකරගත් වාහන වලින් ගම්බද ප්‍රදේශවල ප්‍රචාරක කටයුතුවල නිරතවේ. බලපත්‍ර රහිතව ශබ්දවාහිනී යන්ත්‍ර භාවිතා කරන විට පොලිසියට අත් අඩංගුවට ගැනීමට බලය ඇත.

## රජයේ දේපළ ප්‍රචාරක කටයුතු සඳහා යෙදවීම

රජයේ දේපළ හෝ රජයේ නිලධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යෙදවීම මැතිවරණ නීති උල්ලංඝණයක් මෙන්ම පොදු දේපළ විෂයෙහිලා සිදුකරන වැරදි පිලිබඳ පනත යටතේද අපරාධ වරදකි. මැතිරවණ ප්‍රචාරක කටයුතු සඳහා රජයේ වාහන, ගොඩනැගිලි මෙන්ම රාජ්‍ය නිලධාරීන් භාවිතා කිරීමත් මේ යටතේ වරදක් වේ.

## රජයේ කාර්යාල පරිශ්‍රතුල සිදුකරන ප්‍රචාරයන්

රජයේ කාර්යාල පරිශ්‍රයන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය. නමුත් සමහර දේශපාලන පක්ෂ ආධාරකරුවන් රජයේ කාර්යාල පරිශ්‍රයන් තුල අත් පත්‍රිකා බෙදීම හා කුඩා රැස්වීම් (pocket meeting) පැවැත්වීම මෙන්ම කටවුට් ප්‍රදර්ශනය සිදුපකරනු ලබයි.

# අවසර නොලත් ප්‍රචාරක කාර්යාල

මැතිවරණ ප්‍රචාරක කාර්යාලන් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික්ක් මැතිවරණ කාර්යාලයේ අවසරය ලබාගත යුතුය. එසේ අවසර ලබාදෙන මැතිවරණ ප්‍රචාරක කාර්යාල සම්බන්ධයෙන් ප්‍රමිතීන් හා කොන්දේසි මැතිවරණ කොමිසම විසින් පනවනු ලැබේ. කාර්යාල පරිශ්‍රය තුල අවසර පත්‍රය ප්‍රදර්ශනය කරනු ලැබේ.එකී අවසරය නොලබා පවත්වාගෙන යන කාර්යාල අනවසර ප්‍රචාරක කාර්යාල වේ. එවැනි කාර්යාල ඉවත් කිරීමේ බලය පොලිසියට හා මැතිවරණ කොමිසමේ නිලධාරීන්ට ඇත.

# පෙලපාලි / රථ පෙලපාලි

නාමයෝජනා ඉදිරිපත් කිරීමෙන් පසුව හා මැතිවරණයේ ප්‍රතිඵලය නිකුත් කරන අවස්ථාව දක්වා කාලය තුල ආගමික හා සංස්කෘතික ස්භාවයේ පෙරහැරවල් හැර වෙනත් පෙරහැර හා පෙලපාලි තහනම් වේ. එබැවින් පක්‍ෂ හෝ අපේක්‍ෂකයන් ප්‍රවර්ධනය කරන හෝ විරෝධතා දක්වන පෙලපාලි හෝ රථ පෙලපාලි මැතිවරණ කාලය තුල සම්පූර්ණයෙන්ම තහනම් වේ.

# ඡන්දය ලබාගැනීමේ අපේක්‍ෂාවෙන් භාණ්ඩ බෙදීම

මැතිවරණ සමයේ සිදුවන තවත් බරපතල මැතිවරණ නීති උල්ලංඝණයකි. මැතිවරණ නීති අනුව ඡන්දය ලබාගැනීම හෝ වෙනත් අපේක්‍ෂකයකුට ඡන්දය දීම වැලැක්වීම සඳහා අල්ලස් ලබාදීම වරදකි. එමෙන්ම එම අල්ලස් ලබාගැනීමත් වරදකි.එමෙන්ම අල්ලස් ලබාගැනීමද වරදකි.

# මැතිවරණ දිනයකදී තහනම් ක්‍රියා

මැතිවරණය පවත්වන ඡන්ද පොළ ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන ස්ථානයේ සිට කිලෝමීටර් භාගයක දුර ඇතුළත

1. ඡන්දය ඉල්ලීම.
2. යම් පක්‍ෂයකට ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියන් පෙළඹවීම.
3. ඡන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදීම හෝ වෙනත් ප්‍රචාරක කටයුතු තහනම් වේ.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන, දොරටුව අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයකදී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් ඡන්දපොළ නිළධාරීන්ට හෝ ඡන්ද පොළට පැමිණෙන අයට බාධාවක් ඇතිවන පරිදි ක්‍රියා කිරීම වරදකි.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළගත් ඡන්ද පොළ අසලත් අසංවර ලෙස ක්‍රියා කිරීමද වරදකි.

# දූෂණ ක්‍රියා

- ජීවත්ව සිටින හෝ මිය ගොස් ඇති හෝ ව්‍යාජ පුද්ගලයකු හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෙනී සිටිමින් ඡන්දය දීම.
- තමාගේම නමින් හෝ නම් යටතේ ඡන්ද විමසීමේදී එක් වරකට වඩා ඡන්දය දීම.
- තමාට ඡන්දය දීම වෙනුවෙන් හෝ වෙනත් අයෙකුට ඡන්දය දීම වැලැක්වීම වෙනුවෙන් දූෂිත ලෙස බලපෑම් කිරීම සඳහා යම් සංග්‍රහයක් කිරීම හෝ එවැනි සංග්‍රහයක් ලබා ගැනීම.
- යම් ආගමික රැස්වීම් වලදී ඡන්ද හිමියන් යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම.
- ඡන්දය දීම හෝ නොදීම නිසා ආගමික සංවිධානයකින් නෙරපන බවට බලපෑම් කිරීම.
- යම් අපේක්ෂයකුට ඡන්දය දීම හෝ නොදීම නිසා සේවයෙන් නෙරපන බවට හෝ යම් ප්‍රතිලාභ හෝ සේවාවන් අත්හිටුවන බවට සේවා යෝජකයකු විසින් සේවකයන්ට බලපෑම් කිරීම.
- ඡන්දය දීම හෝ නොදීම සඳහා අල්ලස් ලබාදීම.

# ඡන්ද පත්‍රිකා සම්බන්ධ වැරදි

- ඡන්ද පත්‍රිකාවන් හෝ නිළ ලකුණක් විකෘති කිරීම
- නිළ බලයක් නොමැතිව ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තෙකුට සැපයීම
- ඡන්ද පත්‍රිකා මිළදී ගැනීම හෝ සැපයීම
- නිළ ලකුණ යෙදා ඇති ඡන්ද පත්‍රිකාවන් තම සන්තකයෙහි තබා ගැනීම
- ළකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොල තුලදී ප්‍රදර්ශනය කිරීම

- ඡන්ද පත්‍රිකාවන් නොවන දෙයක් ඡන්ද පෙට්ටියට දැමීම
- ඡන්ද පත්‍රිකාවක් බලය නොමැතිව ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටතට ගෙනයාම
- ඡන්ද පෙට්ටියක් හෝ මුද්‍රා තැබූ ඡන්ද පත්‍රිකා නිළ බලයක් නොමැතිව විවෘත කිරීම හෝ විනාශ කිරීම
- ඡන්ද පත්‍රිකාවන් බලය නොමැතිව මුද්‍රණය කිරීම
- ඡන්දය දීමට නීත්‍යානුකූලව නොහැකිබව හෝ ඡන්දය දීම තමා නුසුදුස්සෙකුව සිටින බව දැන දැනම ඡන්දය භාවිතා කිරීම

# මැතිවරණ නීති උල්ලංඝනයන් හිදී පැමිණිළි කල හැකි ආයතන

- **මැතිවරණ කොමිෂන් සභාව-** ප්‍රධාන කාර්යාලයට හා සිදුවීමට අදාල දිස්ත්‍රිකා කාර්යාලවලට (සබදතා ඉදිරිපිටුවල දක්වා ඇත)

- **ශ්‍රී ලංකා පොලිසිය**- පොලිස් මූලස්ථානයේ ප්‍රධාන මැතිවරණ මෙහෙයුම් මැදිරියට හා පොලිස් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන මැතිවරණ මෙහෙයුම් මැදිරිවලට මෙන්ම 119 හදිසි ඇමතුම් අංකයට පැමිණිලි සිදුකල හැකිය.

- **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**- 1996 අංකයෙන් අමතා පැමිණිලි සිදුකල හැකිය

- **ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයන්ට**- (සබදතා ඉදිරි පරිච්ඡේදවල දක්වා ඇත)

# VIII. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා පුරවැසි භූමිකාව

# VIII. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා පුරවැසි භූමිකාව

නිදහස් හා මැතිවරණයක් සඳහා පුරවැසියන්ට විශාල කාර්යා භාරයක් පවතී. එකී කාර්භාරය ඉටුකිරීම සඳහා වන ක්‍රියාකාරකම් හතක් පහත යෝජනා කරයි.

## දැනුවත් වීම

මැතිවරණ ක්‍රියාවලියට පුරවැසියන්ට දායක වීමට පවතින ප්‍රධානම දුෂ්කරතාරවය වන්නේ පවතින නීතිරීති හා ක්‍රියාවලීන් පිලිබඳව නොදැනුවත් භාවයයි. පුරවැසියකු ලෙස තමන්ගේ අයිතිවාසිකම් මොනවාද ඡන්ද දායකයකු ලෙස ලියාපදිංචි වීමේ වැදගත් කම හා එකී ක්‍රියාවලිය පිලිබඳව මෙන්ම අපේක්ෂකයින්ගේ නීතිමය සුදුසුකම් හා නුසුදුසුකම් පිළිබඳවත් මැතිවරණ නීති උල්ලංඝණයන් යනු මොනවාද පිලිබඳවත් පුරුවැසියන් දැනුවත් වන්නේ නම් බොහෝ අකටයුතු කම් වලක්වා ගත හැකිය.

## දැනුවත් කිරීම

තමන් දැනගත් දේ පිළිබඳව තම පවුලේ අය හා අසල් වාසීන්ව දැනුවත් කිරීම ඉතාමත් වැදගත් වේ. ඒ මගින් මැතිවරණ ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහිවන අතර එමගින් සිය ප්‍රජාතන්ත්‍රිය අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමේ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත්ව භාවිතා කල හැකිය.

## විමසිලිමත් වීම

මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව විමසිල්ලෙන් පසුවීම යහපත් පුරවැසිය වගකීමකි. මැතිවරණ කොමිසමේ කටයුතු, ආණ්ඩුවේ කටයුතු මෙන්ම එක් දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳවද විමසිල්ලෙන් පසුවිය යුතුය. තමන් දන්නා දේ අනුව දේශපාලන පක්ෂ ක්‍රියාකාරින්ගේ ක්‍රියාකාරකම් නීත්‍යානුකූලද නැද්ද යන්න පිළිබඳව විමසිල්ලෙන් පසුවිය යුතුය. විශේෂයෙන්ම යම් යම් ක්‍රියාකාකම් මගින් තමන්ගේ හා අසල් වැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේද, නැතහොත් යම්

ක්‍රියාකාරකමක් නිදහස් හා සාධාරණ මැතිවරණයකට බාධාවක් වන්නේදැයි විමසිල්ලෙන් පසුවිය යුතුය.

# එරෙහි වීම

ක්‍රම විරෝධී ක්‍රියාවන් හා නීති විරෝධී ක්‍රියාවන්ට අනු බල නොදීම මෙන්ම එකී ක්‍රියාවන්ට තම ශක්ති පමණින් විරෝධය දැක්විය යුතුය.

# වාර්තා තබාගැනීම

නීති විරෝධී ක්‍රියාවක් හෝ නිදහස් හා සාධාරණ මැතිවරණයකට බලපෑමක් ඇතිවන ක්‍රියාවක් සිදුවන අවස්ථාවක් පිළිබඳ ඇසුන විට හෝ දුටුවිට ඒ පිළිබඳව නිශ්චිත වශයෙන් වාර්තා තබාගැනීම වැදගත්ය. විශේෂයෙන්ම තම සටහන් පොතක, ජංගම දුරකථනයේ වීඩියෝ ගත කිරීම හෝ ඡායාරූප ගත කිරීම හරහා යම් ක්‍රියාවලියක් පිළිබඳව වාර්තා තබාගත හැකිය.

# පැමිණිලි කිරීම

මැතිවරණ නීති උල්ලංඝනයක් සිදුවන විට ඒ පිළිබඳව නිහඬව නොසිට පැමිණිලි කිරීම යහපත් පුරුවැසියකුගේ පුරවැසි වගකීමකි. එකී පැමිණිලි කිරීම අදාල පරිදි පොලිසියට මැතිවරණ නිලධාරීන්ට හෝ ස්වාධින මැතිවරණ නිරීක්ෂකයින්ට සිදුකල හැකිය. එකී පැමිණිලි කිරීමේ කාර්යය සඳහා වාර්තා තබාගැනීමේ පියවර ඉතා වැදගත් වේ.

# සංවිධානගත වීම

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා පමණක් නොව ශක්තිමත් පුරවැසිභාවයක් සඳහාද සංවිධානගත වීම අත්‍යාවශ්‍යවේ. තනිව සිදුකරනු ලබන මැදිහත් වීමකට වඩා සංවිධානාත්මකව සිදු කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබිය හැකිය. එමෙන්ම තම ආරක්ෂාවද එමගින් වඩාත් තහවුරු වේ. මේ සඳහා පවතින ප්‍රජාතන්ත්‍රිය ආයතන වෙත සංවිධානගත වීම හෝ තම කණ්ඩායම් සමග සංවිධානගත වීම ස්වාධින මැතිවරණ නිරීක්ෂණ ආයතන සමග සංවිධානගත වීම සිදුකල හැකිය.

# IX. යහපත් අපේක්ෂකයකු තෝරාගන්නේ කෙසේද?

# IX. යහපත් අපේක්ෂකයකු තෝරාගන්නේ කෙසේද?

මැතිවරණයකදී නිවැරදි දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම තෝරාගැනීම මෙන්ම නිවැරදි අපේක්ෂකයා තෝරාගැනීමද ඉතාමත් වැදගත් හා තීරණාත්මක වේ. පක්ෂයේ හා ස්වාධීන කණ්ඩායමේ ප්‍රතිපත්ති මෙන්ම අපේක්ෂකයාගේ දැක්ම, හැකියාවන් හා අවංකභාවය ද තෝරාගැනීමේදී වැදගත් වේ.

විශේෂයෙන්ම අපේක්ෂකයකු තෝරාගැනීමේදී ඒ ආයතනයේ කාර්යභාරය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල අපේක්ෂකයාට ධාරිතාවයක් තිබේද යන්න සැලකිලිමත් විය යුතුය. පාර්ලිමේන්තු මැතිවරණයකදී තමන් ඡන්දය ලබාදෙන අපේක්ෂකයාට පාර්ලිමේන්තුවේ කාර්යභාරය එනම් රටේ ප්‍රතිපත්ති සම්පාදනය, නීති සම්පාදනය හා මූල්‍ය පාලනය සිදුකිරීමේ ධාරිතාවක් තිබේද යන්න සැලකිල්ලට ගත යුතුය.

පළාත් සභා නියෝජිතයා ලෙස තෝරාගන්නා පුද්ගලයාට පළාත් සභාවේ කටයුතු පළාත් සභා ප්‍රඥප්ති සම්පාදනය හා පළාත් සංවර්ධනය පිලිබද දැක්මක් හා හැකියාවක් තිබේද යන්න සලකා බැලිය යුතුය.

පළාත් පාලන ආයතනයට තෝරාපත් කරගන්නා නියෝජිතයා අදාල පළාත්පාලන ආයතනයේ හා නිශ්චිත පලාත් පාලන කොට්ඨාශයේ අවශ්‍යතා පිළිබදවත් පළාත් පාලන ආයතන ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය පිලිබදව අවබෝධයක් හා දැක්මක් සහිත මෙන්ම අදාල පාලාත් පාලන බලප්‍රදේශයේ සමීප සබදතා සහිත අයෙක් විය යුතුය.

වැරදි නියෝජිතයකුට ඡන්දය ලබාදීම මගින් ඔහු තෝරාගනු ලබන ආයතනයට(පාර්ලිමේන්තුවට/පළාත් සභාවට/ පාලාත් පාලන ආයතනයට) විශාල අසාධාරණයක් සිදුවනවා මෙන්ම එමගින් සමස්ත සමාජයටද විශාල අයහපතක් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයේ නිරෝගී පැවැත්මට විශාල හානියක්ද සිදුවේ.

## පක්ෂය විසින් සුදුසු අපේක්ෂයන්ට නාම යෝජනා ලබාදීම

අපේක්ෂකයින් සඳහා නාමයෝජනා ලබාදීම සිදුවන්නේ දේශපාලන පක්ෂ වෙතින් නිසා දේශපාලන පක්ෂවල තීරණය ඉතාමත් වැදගත් වේ. මැතිවරණ සඳහා නාමයෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ විසින් අනුගමණය කල යුතු පොදු නිර්ණායක 8 මාර්තු 12 ව්‍යාපාරය විසින් 2015 වර්ෂයේදී හඳුන්වා දුන් අතර ඒ සඳහා සියලුම දේශපාලන පක්ෂ විසින් එකගතාවය දක්වා ඇත.

එම නිර්ණායක නම්-

- අපරාධ වරදක් සඳහා සිරදඬුවමට ලක් වූ හෝ අත්හිටවූ සිරදඬුවම් වලට ලක්වූවකු නොවිය යුතුයි.
- අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරදකරුවෙකු නොවූ සමාජය පිළිගත් චරිතවත් අයෙකු විය යුතුයි. එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා ලැබූ අයගැන පරීක්ෂාකාරී විය යුතුයි.
- මද්‍යාසාර,මත්ද්‍රව්‍ය,සූදු,කැසිනෝ,ගණිකා මඩම් ඇතුළු රටේ යහපැවැත්මට හානිකර ව්‍යාපාර පවත්වාගෙන යන හෝ අතීතයේ එසේ නොකළ අයෙකු විය යුතුයි.
- ජීව ආධාරක ව්‍යුහය විනාශ කරන පාරිසරික වශයෙන් හානිදායක වන ව්‍යාපාරවල යෙදුණු හෝ යෙදෙන අයෙකු නොවිය යුතුයි.
- දේශපාලන බලය අනිසි ලෙස සහ අයුතු ලෙස භාවිතා නොකළ අයෙකු විය යුතුය.
- මහජන නියෝජිතයකු වන්නට පෙර රටට අගතිගාමී මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් සහ මහජන නියෝජිතයකුව සිටිමින් තම දේශපාලන බලය අයුතු ලෙස භවිතා කර රජය සමග මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් හෝ ගිවිසුමක පාර්ශවකරුවෙකු නොවන්නෙකු විය යුතුය.
- නාමයෝජනා ලබාදෙන අපේක්ෂකයා තමා නියෝජනය කරන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු හෝ එම ජනතාව සමග සම්බන්ධතා පවත්වන අයෙකු විය යුතුය.
- නාමයෝජනා ලබා දීමේදී කාන්තා සහ තරුණ නියෝජනය සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබාදීමට ක්‍රියා කළ යුතුයි.

# දේශපාලන පක්ෂවලට කල හැකි බලපෑම

ඉහත සදහන් පොදු නිර්ණායක දේශපාලන පක්ෂ විසින් හුදු ස්වේච්ඡාවෙන්ම අනුගමණය කරනු ඇතැයි උපකල්පනය කිරීම මිත්‍යාවකි. එබැවින් දේශපාලන පක්ෂවලට බලපෑම් සිදු කල යුතුය. එසේ සිදුකල හැකි බලපෑම් අතර-

- සුදුසු අපේක්ෂකයන්ට පමණක් නාමයෝජනා ලබාදෙන ලෙස තම පක්ෂයට බලපෑම් කිරීම.
- තම පක්ෂය සුදුසු අය ඉදිරිපත් නොකරන්නේ නම් සුදුසු අපේක්ෂකයින් ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂවලට හෝ ස්වාධින කණ්ඩායම්වලට තම ඡන්දය ලබාදෙන ලෙස තම ප්‍රාදේශිය දේශපාලන නායකත්වය දැනුවත් කිරීම
- දූෂිත පුද්ගලයන්ට නාමයෝජනා ලබාදීමට විරුද්ධ වීම.
- තම ගමට සේවය කලහැකි දක්ෂ අවංක පුද්ගලයන් වටා පක්ෂභේදයකින් තොරව පෙළගැසීම.
- කාන්තා නියෝජනය වැඩිවීමේ සැබෑ ප්‍රතිඵල ළගාකරගැනීමට දක්ෂ, නිර්මාණශීලි,අවංක කාන්තාවන් ලැයිස්තුවට ඇතුළත් කිරීමට තම නායකත්වයට බලකිරීම.
- මරණාධාර සමිති තරුණ සමිති වැනි ගමේ ක්‍රියාත්මක වන සියළු ප්‍රජා සංවිධානවලදී ඉදිරි පළාත් පාලන ඡන්ද විමසීම ගැන කතා කරන්න.පක්ෂ පාට නොසලකා සුදුස්සන් පමණක් ඔබේ ගමේ නායකත්වයට පත් කිරීමට ක්‍රියාකිරීම.
- නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා වගකීම් සහගත පුරවැසියකු ලෙස කලහැකි උපරිම මැදිහත්වීම සිදුකිරීම.
- තරුණ නියෝජනය සදහා අවස්ථාව ලබාදෙන ලෙස බලපෑම් සිදු කිරීම.

# සමාජය තුල යහපත් අපේක්ෂකයකු පිළිබද සංවාදයක් ඇති කිරීම

- දේශපාලන පක්ෂ හා සියලුම අපේක්ෂයකයින් සඳහා පොදු වේදිකාවක් නිර්මාණය කර එහිදී සියලු දේශපාලන පක්ෂ හා අදාල ප්‍රදේශයට තරග කරන අපේක්ෂයින්ට සිය දේශපාලන ප්‍රතිපත්ති එලි දැක්වීම සදහා අවස්ථාවක් සලසා දීම හා එහිදී එම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා හා අභිලාශයන් පිලිබදව එකී අපේක්ෂකයින් සංවේදී කිරීම හා ඒ පිලිබදව ඔවුන්ගේ ප්‍රතිචාර ලබාගැනීම.
- අපේක්ෂකයින් වෙත ප්‍රාදේශීය අවශ්‍යතා පිලිබදව දැනුවත් කර පොදු ඉල්ලීම් සදහා ප්‍රසිද්ද පොරොන්දු ලබාගැනීම.

- අපේක්ෂකයින් වෙතින් තමන් දූෂණයකින් තොරව ඉදිරියේදී දේශපාලනයේ යෙදෙන බවට සුපිලිපන්න පොරොන්දු ලබාගැනීම.

මැතිවරණයට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයින්ට ලකුණු දීම

ඡන්ද විමසීමේ දිනයේදී තමන් ඡන්දය දෙන්නේ කාටද යන්න පිළිබඳ සාධාරණ තීරණයකට එලඹීම සඳහා මාර්තු 12 ව්‍යාපාරය විසින් හදුන්වාදී ඇති "ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු-ඡන්දය දීමට පෙර "අපේක්ෂකයන්ට ලකුණු දෙමු" නැමති ලකුණු සටහන අදාල කරගත හැකිය.

# ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු-ඡන්දය දීමට පෙර "අපේක්ෂකයන්ට ලකුණු දෙමු"

## පිරිසිදු දේශපාලනයක් සඳහා - මාර්තු 12 ව්‍යාපාරය

## மார்ச் 12 இயக்கம் - சிறந்ததோர் அரசியலுக்காக

## March 12 Movement - for clean politics

**නව පළාත් පාලන**
**ඡන්ද විමසීමේ ක්‍රමය සමග නව දේශපාලන**
**සංස්කෘතියක් ගොඩ නගමු.**

දයාබර පුරවැසියෙනි,

ඔබ මෙවර සහභාගි වන්නේ ඔබේ ගමට ඔබේ ම නියෝජිතයා තෝරා ගන්නා නව පළාත් පාලන ඡන්ද විමසීමකටයි.

ඔබ මෙම ඡන්ද විමසීමේ දී ගනු ලබන තීරණය අනුව ඔබේ ගමේ, ඔබේ නගරයේ හෙට දවස තීරණය කරණු ඇත.

එබැවින් ඔබේ වටිනා ඡන්දය භාවිතා කිරීමට පෙර ඔබේ නියෝජිතයා නිවැරදිව හඳුනාගන්න.

පළාත් පාලන ආයතනය: ....................................................

කොට්ඨාශය: ..............................................................


**ලේකම් කාර්යාලය,**
මාර්තු 12 ව්‍යාපාරය.
නො.16,
බර්ඩ් පෙදෙස,
පාමංකඩ පාර,
කොළඹ 06.

011 2 558 570/1 - 011 2 558 574
011 2 558 572
march12movement@gmail.com
www.cleanpolitics.lk

## ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු, ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු.

| දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම් | ඔබේ කොට්ඨාසයට තරග කරන අපේක්ෂකයන් | සාධාරණ ලෙස මුදල් උපයන්නෙකි | බලය අයුතු ලෙස භාවිතා නොකරන්නෙකි | අල්ලස් හෝ දූෂණ චෝදනා නොලැබූ අයෙකි | ඔබට නිරන්තරයෙන් හමුවිය හැකි සමීප පුද්ගලයෙකි | පරිසරය හානි නොකරන්නෙකි | සමාජ මෙහෙවරට දක්ෂයෙකි | සියළු ජාති, ආගම් සංස්කෘතින්ට ගරු කරන්නෙකි | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

එක් එක් නිර්ණායකයට අදාලව
අපේක්ෂකයා සඳහා ලකුණු ලබාදෙන ක්‍රමය

| | |
|---|---|
| ඉතා හොඳයි | 08 - 10 |
| හොඳයි | 05 - 07 |
| සාමාන්‍යයි | 02 - 04 |
| දුර්වලයි | 00 - 02 |

එක් එක් අපේක්ෂකයාට අදාළව මුළු ලකුණු ගණනය කර වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගන්න

බුද්ධිමත්ව ඡන්දය භාවිතා කරමු. සුදුස්සන් පමණක් ඔබේ පළාත් පාලන ආයතනයට තෝරා ගනිමු.

**මාර්තු 12 ව්‍යාපාරයේ පණිවුඩයකි**

**පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පමණි. සම්පූර්ණ කරන ලද පත්‍රිකා අන් සතු නොකරන්න.**

එසේම මැතිවරණයෙන් පසුව වරින් වර මහජන නියෝජිතයින් සමග පොදු සංවාද ඇති කිරීම හා මහජන නියෝජිතයින්ගේ ක්‍රියාවන් ප්‍රසිද්ධියේ ප්‍රශ්න කිරීම සඳහා පොදු වේදිකාවන් නිර්මාණය කිරීමද යහපත් අපේක්ෂකයකු ලබාගැනීමෙ සඳහා පුරවැසියන්ට සිදු කල හැකි ශක්තිමත් මැදිහත් වීමකි.

# X. මැතිවරණ සමයේ නිතර භාවිතාවන වදන් මාලාව

# X. මැතිවරණ සමයේ නිතර භාවිතාවන වදන් මාලාව

## ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව (Period of an Election)

මැතිවරණයන් පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරන ලැබූ දිනෙන් ආරම්භ වී එම මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කල දිනයෙන් අවසන් වන කාලසීමාව(ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 104 ඒ ව්‍යවස්ථාව).

## මැතිවරණ කොමිෂන් සභාව (Election Commission)

මැතිවරණ පැවැත්වීම හා බැදුන සියළු කටයුතු මෙහෙයවීම සඳහා ආ.ක්‍ර.ව්‍ය.වේ 17 වන සංශෝධනය යටතේ මෙම කොමිෂන් සභාව පිහිටුවන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිමා විසින් පත් කරන සාමාජිකයින් තිදෙනෙකුගෙන් මෙම කොමිසම සමන්විත වේ. මෙම කොමිසම පත්වන්නේ වසර 5ක නිලකාලයක් සඳහාය.

## සහකාර මැතිවරණ කොමසාරිස් (Assistant Commissioner of Elections)

මැතිවරණ මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් නියෝජිතයා මේ නමින් හැදින්වේ. සෑම දිස්ත්‍රික්කයකම සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයක් පවතින අතර මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්ය ඒ ඒ දිස්ත්‍රික්කවල ඉටු කිරීම සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ වගකීමයි.

## දිස්ත්‍රික් තේරීම් භාර නිළධාරි (RO)

මැතිවරණයක නාමයෝජනා භාරගැනීම, ඡන්දය පැවැත්වන ඡන්දය ගනන් කිරීම පිළිබඳව දිස්ත්‍රික්කයේ සිටින ප්‍රධානියා දිස්ත්‍රික් තේරීම් භාර නිළධාරියා ලෙස

හැඳින්වේ. මෙම තනතර ස්ථිර තනතුරක් නොවන අතර මැතිවරණයක් ගැසට් කිරීමෙන් අනතුරුව මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාල දිස්ත්‍රික්ක සඳහා තේරීම්භාර නිළධාරීන්ව ගැසට් පත්‍රයේ පළකිරීම මගින් පත් කරනු ලබයි. මොහු ඡන්දය පැවැත්වන කාලය තුල මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝජිතයා ලෙස කටයුතු කරයි. සැම විටම මෙම තනතුර සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන්නේ අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාය.

## සහකාර තේරීම් භාර නිළධාරී (ARO)

තේරීම්භාර නිළධාරීන්ගේ සහකාර නිළධාරීන් ලෙස කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික්කයකට සඳහා සහකාර තේරීම්භාර නිළධාරීන් ගනනක් පත්කරනු ලැබේ. ඡන්ද දිනයේදි ජංගම සංචාරයේ යෙදෙමින් මැතිවරණ කටයුතු අධීක්ෂණය හා ඡන්ද ගනන් කිරීම අධීක්ෂණය මොවුන්නේ ප්‍රධාන කාර්යන් වේ.

## ජ්‍යෙෂ්ඨ ඡන්ද පොල නිළධාරී (SPO)

ඡන්ද මධ්‍යස්ථානයේ සිටින ජ්‍යෙෂ්ඨම නිළධාරියා මේ නමින් හැඳින්වේ. ඡන්ද මධ්‍යස්ථාන තුල පමණක් නොව එය කේන්ද්‍රකරගත් මීටර් 500 ක සීමාව තුල ඔහුගේ උපදෙස් අනුව මෙහෙය වීමේ බලය ඔහු සතුය.ඡන්ද මධ්‍යස්ථානය තුල අවසාන තීරණය ගන්නේ මෙම නිළධාරියා විසිනි.

## කණිෂ්ඨ ඡන්දපොල නිළධාරී (JPO)

ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිළධාරියගේ සහයක නිළධාරියාවේ. ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිළධාරියා වෙනුවෙන් කටයුතු කරමින් ඔහුට සහය වීම මොහුගේ වගකීමයි.

## ඡන්ද මධ්‍යස්ථාන නියෝජිත (Polling Agent)

ඡන්දයට ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂ විසින් හා ස්වාධීන කණ්ඩායම් විසින් තම අපේක්ෂකයින්ගේ අයිතිවාසිකම් වෙනුවන් ඡන්දය නිසි පරිදී සිදුවෙනවා දැයි නිරීක්ෂණ කිරීම සඳහා ඡන්දපොල නියෝජිතයින් පත්කරනු ලැබේ. එක් ඡන්ද මධ්‍යස්ථානයක් සඳහා එක් පක්ෂයකයකට හෝ ස්වාධීන කණ්ඩායමකට නියෝජිතයින් දෙදෙනකු බැගින් පත්කල හැකිය.

## නිළ ඡන්ද දැන්වීම් පත්‍රිකාව (Official Poll Card)

ඡන්දය පැවැත්වෙන දිනය, ඡන්ද මධ්‍යස්ථානයේ අංකය, ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ස්ථානය හා ඡන්ද දායකගේ අනුක්‍රමික අංකය ආදී විස්තර ඇතුලත් තේරීම්භාර නිළධාරී විසින් සෑම ලියාපදිංචි ඡන්ද දායකයකු වෙතම තැපැල් මගින් ලබාදෙන මැතිවරණය පිළිබඳ දැන්වීම නිළ ඡන්ද දැන්වීම් පත්‍රිකාව ලෙස හැඳින්වේ. මේ සමග ඡන්ද අපේක්ෂක ලේඛනයක්ද සපයනු ලැබේ.

## ඡන්ද පත්‍රිකාව (Ballot Paper )

ඡන්ද දායකයකු තම ඡන්දය හා මනාපය ලකුණු කරන්නේ ඡන්ද මධ්‍යස්ථානයේ දී මැතිවරණ නිළධාරින් විසින් ලබාදෙන මෙම ඡන්ද පත්‍රිකාව මගින්ය. එකී ඡන්ද පත්‍රිකාව ඡන්ද මධ්‍යස්ථානය තුලදීම ලකුණුකර ඡන්ද පෙට්ටියට දැමිය යුතුය. ප්‍රධාන ඡන්ද පත්‍රිකාවකින් හා උප පත්‍රිකාවකින් යුතු අතර සෑම ඡන්ද පත්‍රිකාවකම අනුක්‍රමික අංකයක්ද දක්නට ලැබේ.

## ද්විත්ව ඡන්ද පත්‍රිකාව (Tendered Ballot Paper)

ඡන්ද දායකයකු ඡන්දය දීම සඳහා පැමිණෙන විට ඔහුට හිමි ඡන්දය වෙනත් පුද්ගලයකු විසින් ඒ වනවිටත් භාවිතා කරන ඇතිවිටක. ඡන්ද මධ්‍යස්ථානය තුල ඇතිවන නොසන්සුන්තාවය පාලනය කිරීම.

සඳහා නිකුත් කරන නිල්පැහැති වර්ණයෙන් යුතු ඡන්ද පත්‍රිකාව ද්විත්ව ඡන්ද පත්‍රිකාව ලෙස හඳුන්වනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකාව වර්ණයෙන් හැර සියළු අතින්ම ඡන්ද පත්‍රිකාව සමාන වන අතර ඡන්ද ගනන් කිරීමේදී මෙම ඡන්ද පත්‍රිකාව ගනන් කරනු නොලැබේ.

## ඡන්ද නාම ලේඛනය (Register of Electors)

ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සකස් කරණු ලබන ලේඛනය ඡන්ද නාමලේඛනය ලෙස හඳුන්වනු ලැබේ. වාර්ෂිකව ඡන්ද නාමලේඛණ සංශෝධනය සිදුකරන අතර එය ග්‍රම නිළධාරී වසම් මට්ටමින් සිදු කරනු ලබයි. එහිදී ඡන්ද නාමලේඛනයට නම ඇතුලත්වන ඡනද් දායකයින්ට පමණක් එම ඡන්ද නාමලේඛනය පදනම්කරගෙන පවත්වන මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමේ අයිතිවාසකම

හිමිවේ.එබැවින් සෑම වර්ෂයකම ඡන්ද නාමලේඛන සංශෝධනයේදී තම නම තමන් සාමාන්‍ය පදිංචිය පවත්වාගෙන යන නිවසට අදාලව ලියාපදිංචි කිරීම වයස අවුරුදු 18 සම්පූර්ණ වු සෑම පුරවැසියකුගේම වගකීමකි.

## මැතිවරණ කොට්ඨාශය (Electoral District )

ඡන්දය ගනන් කිරීම සඳහා පාදක කරගන්නා ප්‍රදේශය මැතිවරණ කොට්ඨාශය ලෙස සැලකේ පාර්ලිමේන්තු මහා මැතිවරණය ජනාධිපතිවරණ පළාත් සභා මැතිවරණ හා ජනමත විචාරණ වලදී මැතිවරණ කොට්ඨාශය ලෙස සලකන්නේ පරිපාලන දිස්ත්‍රික්කයක්ය. නමුත් යාපනය හා කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්ක දෙකම එකතුකර යාපනය මැතිවරණ කොට්ඨාශයද වව්නියා මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්ක 3 එක් කර වන්නි මැතිවරණ කොට්ඨාශද සකස්කර ඇති නිසා ලංකාවේ පවතින්නේ මැතිවරණ කොට්ඨාශ 22 කි.

නමුත් පලාත් පාලන ඡන්ද විමසීමකදී මැතිවරණ කොට්ඨාශය ලෙස සලකන්නේ අදාල පළාත් පාලන ආයතන බල ප්‍රදේශයයි.

## ඡන්ද ප්‍රදේශය (Polling Division)

කේවල ආසන ක්‍රමය (පැරණි ක්‍රමය) යටතේ පැවති ආසන (මැතිවරණ කොට්ඨාශ) ඡන්ද ප්‍රදේශ ලෙස සලකයි.ඡන්ද ප්‍රතිඵල නිකුත් කිරීමේදී මෙන්ම ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේදීද මෙම ඡන්ද ප්‍රදේශ භාවිතයට ගනු ලබයි.

## ඡන්ද කොට්ඨාශය (Polling District)

ඡන්ද මධ්‍යස්ථානයකට අයත් බලප්‍රදේශයට අදාල ඡන්ද දායකයන් පදිංචි සීමාව ඡන්ද කාට්ඨාශය ලෙස සලකනු ලැබේ. ඡන්ද කොට්ඨාශය ඡන්ද වැඩිවන වීට එකි ඡන්ද කොට්ඨාශය තුල ඡන්ද මධ්‍යස්ථාන 2 ක් හො 3 ක් පවත්වනු ලැබේ (එකම ස්ථානයේ).

## නිවේදිත ප්‍රචාරක කාර්යාල

පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් මැතිවරණ ප්‍රචාරක කටයුතු.

සඳහා තේරීම්භාර නිළධාරීගේ අවසරය මත හා පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම් දී පවත්වාගෙන යනු ලබන මැතිවරණ ප්‍රචාරක කාර්යාල මේ නමින් හැඳින්වේ.

# සහතික කිරීමේ නිළධාරියා

තැපැල් ඡන්ද අයදුම් කිරීමේදී හා තැපැල් ඡන්දය භාවිතා කිරීමේ දී තැපැල් ඡන්ද අයදුම් කරන හා තැපැල් ඡන්ද දායකයනගේ අනන්‍යතාවය සහතික කරන එකී ඡන්ද දායකයනගේ ආයතනයේ ප්‍රධාන නිළධාරියා සහතික කිරීම් නිළධාරියා ලෙස හැඳින්වේ. තැපැල් ඡන්ද දිනයේදී මොහු ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිළධාරීගේ නිළයට සමාන වගකීමක් දරයි.

# වලංගු හැඳුනුම්පත්

ඡන්දය භාවිතා කිරීමේ දී හඳුනා ගැනීම සඳහා හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්යවෙ. මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණයේදී පිළිගනු ලබන්නේ යැයි නිවේදනය කරනු ලබන හැඳුනුම්පත් එකී ඡන්දය සඳහා වලංගු හැඳුනුම්පත් ලෙස සලකනු ලැබේ. මැතිවරණ කොමිසම විසින් මේ වන විට ප්‍රකාශයට පත් කර ඇති වලංගු හැදුනුම්පත් වන්නේ-

1. ජාතික හැදුනුම්පත
2. වලංගු ගමන් බලපත්‍රය
3. වලංගු රියැදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැදුනුම්පත
5. වැඩිහිටි හැදුනුම්පත
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පූජ්‍ය / පූජක පක්ෂය සඳහා නිකුත් කර ඇති හැදුනුම්පත
7. මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැදුනුම්පත

# XI. මැතිවරණ නිලධාරීන්ගේ දුරකථන සම්බන්ධතා

# XI. මැතිවරණ නිළධාරීන්ගේ දුරකථන සම්බන්ධතා

මැතිවරණ කොමිෂන් සභාව- තැ:පෙ: 02 සරණ මාවත,රාජගිරිය- 10107

| නිළදාරියා | දුරකථනය | ෆැක්ස් | ඉමේල් |
|---|---|---|---|
| සභාපති-මහින්ද දේශප්‍රිය මහතා | 0112868444 | 0112868445 | chairman@elections.gov.lk |
| සාමාජික- එන්.ජේ.අබේසේකර මහතා | 0112879131 | 0112879131 | member.abeysekara@elections.gov.lk |
| සාමාජික- එස්.රත්නජීවන් එස්.හුල් මහතා | 0112879132 | 0112879132 | member.rathnajeewan@elections.gov.lk |
| ලේකම් | 0112879133 | 0112879133 | secretary@elections.gov.lk |

මැතිවරණ මහලේකම් කාර්යාලය- තැ:පෙ: 02 සරණ මාවත, රාජගිරිය- 10107

| නිළධාරියා | දුරකතනය | ෆැක්ස් | ඉමේල් |
|---|---|---|---|
| පොදු | 0112868441, 0112868442, 0112868443 | 0112868426 | info@elections.gov.lk |
| අධ්‍යක්ෂක ජෙනරාල් | 0112885207 | 0112885208 | dgelection@elections.gov.lk |
| පාර්ලිමේන්තු මැතිවරන අංශය | 0112868962 | 0112868962 | addcompe@elections.gov.lk |
| පලාත් පාලන අංශය | 0112868446 | 0112868367 | addcomla@elections.gov.lk |

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල

| **දිස්ත්‍රික් කාර්යාලය** | **දුරකතනය** | **ෆැක්ස්** | **ඉමේල් ලිපිනයන්** |
|---|---|---|---|
| අනුරාධපුර | 0252222551 | 0252222551 | anuradhapura@elections.gov.lk |
| අම්පාර | 0632224342 | 0632222077 | ampara@elections.gov.lk |
| බදුල්ල | 0552222424 | 0552222424 | badulla@electioms.gov.lk |
| මඩකලපුව | 0652224312 | 0652224374 | batticaloa@gmail.lk |
| කොළම(නගර) | 0112872247 | 0112872248 | cplombocity@elections.gov.lk |
| කොළම(දිස්ත්‍රික්) | 0112867472 | 0112867471 | colomodistrict@elections.gov.lk |
| ගම්පහ | 0332222047 | 0332222047 | gampaha@elections.gov.lk |
| ගාල්ල | 0912234028 | 0912234028 | galle@elections.gov.lk |
| හම්බන්තොට | 0472256248 | 0472256248 | hambantota@elections.gov.lk |
| යාපනය | 0212222655 | 0212228002 | jaffna@elections.gov.lk |
| කළුතර | 0342222266 | 0342222266 | kaluthara@elections.gov.lk |
| මහනුවර | 0812233187 | 0812233187 | kandy@elections.gov.lk |
| කැගල්ල | 0352222561 | 0352222561 | kegalle@elections.gov.lk |
| කුරුනැගල | 0372222369 | 0372222369 | kurunegala@elections.gov.lk |
| මාතලේ | 0662222422 | 0662222422 | matale@elections.gov.lk |
| මාතර | 0412222305 | 0412222305 | matara@elections.gov.lk |
| මන්නාරම | 0232222289 | 0232222289 | mannar@elections.gov.lk |
| මොනරාගල | 0552276315 | 0552276315 | monaragala@elections.gov.lk |
| නුවරඑළිය | 0522222325 | 0522222325 | nuwaraeliya@elections.gov.lk |
| පොලොන්නරුව | 0272222012 | 0272222012 | pollonnaruwa@elections.gov.lk |
| පුත්තලම | 0322265246 | 0322265246 | puttalam@elections.gov.lk |
| රත්නපුර | 0452222023 | 0452222023 | ratnapura@elections.gov.lk |

| | | | |
|---|---|---|---|
| ත්‍රිකුණාමළය | 0262222304 | 0262222304 | trinco@elections.gov.lk |
| වවුනියාව | 0242222311 | 0242222311 | vavuniya@elections.gov.lk |
| කිලිනොච්චි | 0212285664 | 0212285664 | kilinochchi@elections.gov.lk |
| මුලතිව් | 0212061426 | 0212061426 | mulativu@elections.gov.lk |

මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළවෙබ් අඩවිය වන http://www.slelections.gov.lk/ වෙතින් උපුටා ගන්නා ලදී (2018නොවැම්බර් 10 දින).

# XII. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන

# XII. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන

## නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කරනු වස් මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ අරමුණින් හා එහා සම්බන්ධ ක්‍රියාවලියට මැදිහත් වීමේ අරමුණින් යුතුව 1987 වසරේදී පැෆ්රල් සංවිධානය ආරම්භ කරන ලදී. 1987 වසරේ සිට මෙතෙක් පැවති සියලුම මැතිවරණ සම්බන්ධයෙන් නිරීක්ෂණ කටයුතු සිදු කල පැෆ්රල් සංවිධානයට මේ වන විට ඡන්ද මධ්‍යස්ථානවලට ස්ථානීය නිරීක්ෂකයින් යෙදවීමේ අවසරය මැතිවරණ කොමිසම විසින් ලබාගෙන ඇත. එයට අමතරව 2015 වසරේ සිට ඡන්ද ගනන් කිරීමේ මධ්‍යස්ථාවලටද නිරීක්ෂකයින් යොමු කිරීමේ අවසරය ලැබී ඇත.

සාමාන්‍ය මැතිවරණ නිරීක්ෂණයන්ට අමතරව මැතිවරණ ක්‍රියාවලියේ ස්වාධිනත්වය වෙනුවෙන් ක්‍රියාමර්ග රාශියක් පැෆ්රල් සංවිධානය විසින් ගෙන ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරවරණ ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීම් සිදුකිරීම, ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝගයක් සිදුවන අවස්ථාවන්හිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු පැවරීම් සිදුකරමින් පුරවැසියන් වෙනුවෙන් වඩාත් නිදහස් හා ස්වාධින මැතිවරණ සදහා හිතකර වූ අධිකරණ තීරණ ලබාගැනීම සදහා කටයුතු කිරීම මේ අතරින් ඉතා වැදගත් ක්‍රියාකාරකම් වේ.

## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (සීඑම්ඊවී)

ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණයක් සහතික කිරීම සදහා මැතිවරණ නිරීක්ෂයේ යෙදීම අරමුණු කරුගෙන සීඑම්ඊවී ආයතනය ආරම්භ කරන ලදී. ඡන්ද මධ්‍යස්ථාන තුල ස්ථානිය නිරීක්ෂකයින් මගින් නිරීක්ෂණය කිරීමට මෙන්ම ඡන්දය ගනන් කිරීමේ ස්ථාන නිරීක්ෂණය කිරීමටද සීඑම්ඊවී සංවිධානයට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසරය ලබාදී ඇත.

මෙම ආයතනයද ඡන්ද දායකයින් දැනුවත් කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණයේ නඩු පැවරීම් හරහා නිදහස් හා සාධාරණ මැතිරවණයන් සඳහා අවශ්‍යවන අධිකරණ තීන්දු ලබාගැනීමද සීඑම්ඊවී ආයතනය විසින් මේ වන විට සිදුකර ඇත.

# මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල සම්බන්ධතා

| සංවිදානය | ලිපිනය | දුරකථන |
|---|---|---|
| නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.(PAFFREL) | නො.16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06. | 011 2 558 570<br>011 2 558 571 |
| මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂණ මදයස්ථානය (CMEV) | අංක.160G, පූර්වාරාම පාර, කිරුළපන, කොළඹ 05. | 011 2 505980 |



PAFFREL


PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

# No.16, Byrde Place, Off Pamankada Rd,
Colombo 06, Sri Lanka.

Tel: (+94) 11 2 558 570 / 1
Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk
Website: www.paffrel.lk



ISBN 9789554082069

9 789554 082069